(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටසේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රුපියල් පනහ (රු.50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත් ; සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 - 12/5

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින නිකවැරටිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක 5 (XII)-(VI) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම (2020)

යෝජනා අංක - 5 (XII)-(VI)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තකුගේම එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වාර්ෂික බද්දක් 2020 වර්ෂය සඳහා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

1 වැනි තීරුව	*11 වැනි තීරුව* *රු. ශත*
(1) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් -	
(*අ*) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(*ආ*) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(i) සෑම කරත්තයක් සඳහාම	20 0
(ii) සෑම අත් කරත්තයක් සඳහාම	10 0
(iii) සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(iv) සෑම ඇතෙකු, අලියෙකු සඳහාම	50 0
(v) සෑම රික්ෂෝවක් සඳහාම	7 50
(vi) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0

11 - 12 - 12/6

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම 2020

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 5 (XII)-(VII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

විනෝද බදු පැනවීම

යෝජනා අංක - 5 (XII)-(VII)

විනෝද බදු ආඥාපනතේ සඳහන් විධිවිධාන අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් විනෝද බදු හැර සියයට දහයක බදු ප්‍රතිශතයක් අය කිරීමටත් මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටියක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකළ යුතු බදු මුදල් එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට හතයි දශම පහක් (7.5%) ක් ලෙස අඩු කිරීමටත් 2009.09.22 වැනි දිනැති මහ සභා රැස්වීමේ දී යෝජනා සම්මත කර ඇති අතර, එකී යෝජනාවට ගරු වයඹ ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බව වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ව/ප්‍රඅලේ/ආ08/64 හා 2011.01.31 දිනැති ලිපියෙන් දක්වා ඇති අතර එකී අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් පළකිරීමෙන් පසු එම ගැසට් පත්‍රයේ සඳහන් දින සිට නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අයකළ යුතු යැයි යෝජනා කරන්නීය.

12 - 12/7

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම (2020)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (XII)-(VIII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු පැනවීම - (2020)

යෝජනා අංක 5 (XII)-(VIII)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22(4) හා 122-126 වැනි වගන්තිවලින් නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, 1988.08.23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම්,බැනර් ඇලවීම, ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයට පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

1 වැනි තීරය විස්තරය	*11 වැනි තීරය* අය කරන ගාස්තුව	රු. ශත
01. බිත්තියක හෝ තාප්පයක, පුවරුවක ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා (සෑම වසරකම ගෙවිය යුතුය)	වර්ග අඩියකට	60 0
02. එක් මසකට වැඩි මාස තුනකට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා	වර්ග අඩියකට	30 0
03. මාස එකක් හෝ ඊට අඩු කාලයක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා	වර්ග අඩියකට	20 0
04. කටවුට් සඳහා මාස තුනකට වැඩි කාල සීමාවකට	වර්ග අඩියකට	40 0
05. කටවුට් සඳහා මාස තුනකට අඩු කාල සීමාවකට	වර්ග අඩියකට	30 0
06. සභාව සතු නිකවැරටිය නගරයේ ඇති භූමිය තාවකාලිකව වෙළෙඳ කුටි එළිමහන් ප්‍රදර්ශන පැවැත්වීම වෙනුවෙන් එක් දිනකට	වර්ග අඩියකට	25 0
07. චිත්‍රපටි දර්ශන, ආධාර චිත්‍රපට දර්ශන, මැජික් සංදර්ශන, සර්කස්, නැටුම් සංදර්ශන, හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම අලෙවි කරනු ලබන සෑම ප්‍රවේශ පත්‍රයකින්ම 10% ක බදු මුදලක් ගෙවිය යුතු ය.		
08. ප්‍රසිද්ධ සංදර්ශන බලපත්‍ර ගාස්තුව එක් දිනක් සඳහා		500 0

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව සේවා ගාස්තු අය කිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයට සේවා සැපයීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු 2020.01.01 දින සිට පනවා අය කිරීමට 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවත්වන ලද නිකවැරටිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 5 (XII)-(IX) යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සේවා සඳහා ගාස්තු අයකිරීම (2020)

යෝජනා අංක 5 (XII)-(IX)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා 2020.01.01 වැනි දින සිට 2020.12.31 වැනි දින දක්වා පහත සඳහන් පරිදි ගාස්තු අය කළ යුතු බවට නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරය	*II වැනි තීරය*
		රු. ශත
1.	පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තු	100 0
2.	පරිසර ගාස්තු	වටිනාකම අනුව
3.	බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු	50 0
4.	පරිසර බලපත්‍ර ගාස්තු	1250 0
5.	සියලුම නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු	වර්ග අඩි ප්‍රමාණය අනුව

	වර්ග ප්‍රමාණ	*නිවාස* රු. ශත	*ව්‍යාපාර* රු. ශත
	වර්ග අඩි 2000 දක්වා	500 0	750 0
	වර්ග අඩි 2000 ට වැඩි සෑම වර්ග අඩි 100 සඳහාම	100 0	200 0
6.	අලුතින් ඉදිකරන තාප්ප සඳහා වර්ග අඩියකට	2 0	4 0
7.	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු	600 0	
8.	වීථි රේඛා පරීක්ෂණ ගාස්තු	500 0	
9.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	500 0	
10.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු පරීක්ෂා කිරීමේ ගාස්තු	500 0	

11. ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර සහ වලංගු කාලය දීර්ඝ කිරීම උපරිමය වසර 3 දක්වා

කාලය	*නිවාස* රු. ශත	*ව්‍යාපාර* රු. ශත
1 වසර	100 0	200 0
2 වසර	200 0	300 0
3 වසර	300 0	400 0

12. *සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සඳහා දඩ මුදල් අයකිරීම*

(i) තාප්ප සඳහා වර්ග අඩියකට පෙරසැරි ගාස්තු මෙන් දෙගුණයකි.

(ii) නගර සීමාව තුළ අනවසරයෙන් ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා ආවරණ අනුමැතිය දීමට ගාස්තු අයකිරීම.

විස්තරය (වර්ග මීටරයක් සඳහා)	*නේවාසික ව්‍යාපාර රු. ශත*	*ව්‍යාපාර රු. ශත*
(i) අත්තිවාරම සම්පූර්ණ කර ඇති විට	25 0	25 0
(ii) වහල මට්ටම දක්වා	40 0	50 0
(iii) වහලය ඇතුළුව ඉදි කොට ඇති විට	60 0	100 0
(iv) සම්පූර්ණයෙන්ම වැඩ නිමකොට ඇති විට	100 0	150 0

13. අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව 1,000 0 2,000 0

14. සතිපොල කඩ කාමර සඳහා ගාස්තු අය කිරීම -

(i) අඩි 08 x අඩි 06 ප්‍රමාණයේ කඩ කාමර සඳහා 200 0

(ii) විවෘත භූමිය අඩි 08 x අඩි 06 සඳහා 150 0

ප්‍රාදේශීය සභාවේ වෙනත් ගාස්තු		*රු. ශත*
පුස්තකාල සාමාජික ගාස්තු	වැඩිහිටි	75 0
	ළමා	50 0
ටෙන්ඩර් දඩ දිනකට		10%
පිඹුරු අනුමත කිරීමේ ගාස්තු		500 0
පුස්තකාල අයදුම්පත් ගාස්තු		15 0
තක්සේරු ලේඛනයෙහි නම වෙනස් කිරීමේ ගාස්තු		150 0

15. *ඉඩම් කට්ටි සැලැස්ම හෝ අනු බෙදුම අනුමත කර දීමේ ගාස්තු අයකිරීම* -

ප්‍රමාණය	*සංවර්ධන සැලැස්ම රු. ශ*	*අනු බෙදුම රු. ශත*	*සේවා ගාස්තු රු. ශත*
හෙක්ටයාර් 1ට අඩු	250 0	250 0	එක් කාර්යයක් සඳහා රු.750
හෙක්ටයාර් 01 - 02	350 0	350 0	එම
හෙක්ටයාර් 02-04	500 0	500 0	එම
හෙක්ටයාර් 04ට වැඩි	750 0	750 0	එම

16. සභා බලප්‍රදේශයේ අනුමැතියට පෙර ඉදිකරන ලද සම්ප්‍රේෂණ කුළුණු සඳහා (කුළුණු ධාරිතාව කියුබික් මීටර්) x 200.00 යන පදනමින් දඩ මුදල් අයකරනු ලැබේ.

17. ආදාහනාගාර ගාස්තු අයකිරීම.

		රු. ශත
(i) බල ප්‍රදේශය තුළ	-	7,000 0
(ii) බල ප්‍රදේශයෙන් පිටත	-	8,000 0

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ගාස්තු අයකිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවැති නිකවැරටිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 5 (XII)-(X) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම (2020)

යෝජනා අංක 5 (XII)-(X)

වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක 1703 /18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.06.24 වැනි දින පැවති මහ සභාව විසින් පිළිගෙන අංක 1785 හා 2012.11.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) වැනි කොටසෙන් නිවේදනය කර ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකළ යුතු යැයි නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

1 වැනි තීරය	*11 වැනි තීරය එක් වරක් පමණක් ගෙවන වාර්ෂික ගාස්තුව රු. ශත*	*111 වැනි තීරය නවතා තැබීමේ ගාස්තුව දිනකට රු. ශත*
01. සෑම මගී ප්‍රවාහන බස් රථයක් සඳහාම	1,000 0	50 0
02. සෑම ත්‍රිරෝද රථයක් සඳහාම	900 0	50 0
03. මගී ප්‍රවාහන බස් රථ, ත්‍රිරෝද රථ නොවන වෙනත් වාහන සඳහා	900 0	50 0

02. කුලී ගමන් අපේක්ෂාවෙන් තොරව ප්‍රාදේශීය සභා භූමිය තුළ පිහිටි රථගාලකට පැයකට අධික කාලයක් නවතා තබන ලද වාහනයකින් රු. 50.00 ක මුදලක්ද යතුරු පැදියකින් රු. 25.00ක මුදලක්ද අයකරනු ලැබේ.

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

සංචාරක වෙළෙඳාම් කිරීම සඳහා ගාස්තු අයකිරීම (2020)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (XII)-(XI) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනා අංක 5 (XII)-(XI)

සංචාරක වෙළෙඳාම් කිරීම සඳහා ගාස්තු අය කිරීම (2020)

වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටස් පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බව 2011.04.28 දිනැති අංක 1703 /18 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2011.06.24 වැනි දින පැවති මහ සභාව විසින් පිළිගෙන අංක 1785 IV(අ) කොටසෙහි නිවේදනය කර ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සංචාරක වෙළඳ බලපත්‍රයක් සඳහා 2020 වර්ෂයට ගාස්තුවක් අයකළයුතු යැයි නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 01 සිට රු. 750 දක්වා රු. ශත	*රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*රු. 1,500 ට වැඩි රු. ශත*
01. තැඹිලි, කුරුම්බා වෙළඳාම	200 0	400 0	600 0
02. කඩල වඩේ, මුරුක්කු, බයිට්ස් පැකට් වෙළඳාම	200 0	400 0	600 0
03. විදුලි උපකරණ අලෙවිය	500 0	750 0	1,000 0
04. බිම්මල් අලෙවිය	200 0	400 0	600 0
05. රෙදි අලෙවිය	300 0	500 0	800 0
06. පාවහන් වෙළඳාම	300 0	500 0	750 0
07. සාප්පු බඩු අලෙවිය	300 0	500 0	750 0
08. මල්පැල, එළවළු පැල හා පළතුරු පැල අලෙවිය	250 0	500 0	750 0
09. පොත් , පත්තර වෙළෙඳාම	300 0	500 0	750 0
10. ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම	500 0	750 0	1,000 0
11. ධාන්‍ය වර්ග පැකට්කර විකිණීම	300 0	500 0	750 0
12. එළවළු හා පළතුරු වෙළෙඳාම	200 0	400 0	600 0
13. කෘත්‍රිම මල් අලෙවිය	300 0	500 0	750 0
14. ජංගම බැංකු සේවා	500 0	750 0	1,000 0
15. පහන්තිර, හඳුන්කුරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය	200 0	400 0	600 0
16. ලොතරැයි අලෙවිය	200 0	400 0	600 0
17. ඔරලෝසු වෙළෙඳාම	250 0	500 0	750 0

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අයකිරීම (2020)

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අයකිරීමට 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවත්වන ලද නිකවැරටිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 5 (XII)-(XII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 12/12

යෝජනා අංක 5 (XII)-(XII)

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අයකිරීම (2020)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ ඉඩම් විකිණීම මත බදු අයකිරීම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර්කරුවෙකු විසින් ඔවුන්ගේ සේවකයා විසින් නැතහොත් නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ, නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එම විකිණීමෙන් ලැබෙන මුදලින් (1%) බද්දක් 2020 වර්ෂයට පනවා අයකිරීමට තීරණය කර ඇති බවත්, එම බද්ද ගෙවීමට අදාළ ඉඩම් විකුණූ වර්ෂය අවසානයට පෙර අයවිය යුතු බවත්, නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

නිකවැරටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයෙහි නොවැම්බර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 5 (XII)-(XIII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. පී. පතිරණ,
සභාපති,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනා අංක 5 (XII)-(XIII)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය (20 ට 1) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම්, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 1% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළයුතු යැයි නිකවැරටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 12/13

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (B) යටතේ පහත උපලේඛනයේ දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබවුහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂය සඳහා බලාත්මක කරන ලද සත්‍යෝක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා සත්‍යෝක්ෂණය කිරීම ලෙස පිළිගත යුතු බවටත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස්කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2020 වර්ෂය සඳහා රුපියල් දහය (රු. 10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989 මාර්තු 10 වැනි දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු වූ සෑම ඉඩමක් මත, 2020 වර්ෂය සඳහා රුපියල් පනහ (රු. 50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට ; සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ 2020 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 - 16/1

කල්පිටිය ප්‍රාදේශීය සභාව

කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.1 (C) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේ දී කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2019 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක් (1%) ක බලපත්‍ර ගාස්තුව ලෙස 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තුව
		රු. ශත	රු. ශත	රු. ශත
	අප්‍රසන්න ව්‍යාපාර :			
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
6.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
8.	කරවල, ලූණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
9.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
10.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
11.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
12.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
13.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
15.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
17.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
20.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
21.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
23.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
24.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
25.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
26.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
27.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
28.	දැව ඉරීම	500 0	750 0	1,000 0
29.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
35.	පාසැල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තුව
		රු. ශත	රු. ශත	රු. ශත
36.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
37.	ටයර්, ටියුබ් වෝල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
38.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
40.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
41.	අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම	500 0	750 0	1,000 0
42.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
43.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
44.	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
45.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
46.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
47.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
48.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
49.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
50.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
51.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
52.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
53.	කාපට් නිපදවීම	500 0	750 0	1,000 0
54.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
55.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
56.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
57.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
58.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
59.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
60.	උළු නිපදවීම	500 0	750 0	1,000 0
අන්තරාදායක ව්‍යාපාර :				
1.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
2.	පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
4.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	වීදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
6.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
7.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
8.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
9.	හිරිගල් හෝ හුණුගල් කැණීම	500 0	750 0	1,000 0
10.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තුව
		රු. ශත	රු. ශත	රු. ශත
13.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
14.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
15.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
16.	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
17.	කළු ගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
18.	ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
19.	මෙතිලේටඩ් ස්පිරිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	තේ පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
	අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :			
1.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
2.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
3.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
4.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
6.	මෝරතෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
7.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
8.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
9.	ලෝහ වර්ග පෑස්සවීම	500 0	750 0	1,000 0
10.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
12.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
" 14.	විෂබීජ නාශක නිපදවීම			
15.	තලාතු මිනිරන් සුද්ද කිරීම	500 0	750 0	1,000 0
16.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
17.	එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
	වෙනත් අතුරු ව්‍යවස්ථා යටතේ වන ව්‍යාපාර :			
1.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බත්කඩයක්, ආපන ශාලාවක්, තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	කිරි පට්ටියක් හා කිරි වෙළඳාමක් කිරීම	500 0	750 0	1,000 0
6.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තුව
		රු. ශත	රු. ශත	රු. ශත
9.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොණ්ඩා සැලුන් හා බාබර් සැලුන් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පෞද්ගලික වෙළඳපොලක් හෝ වෙනත් බලයලත් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
15.	අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 16/2

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කල්පිටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි i වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි ii වැනි තීරුවේ, අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ඔසු පැන්හලක්, කොළ කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටෙස්ට් කඩල) විකිණීම	500 0	750 0	1,000 0
6.	පානීය ජලය බෝතල් ගතකර ගබඩා කර තබාගැනීම හා විකිණීම සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	තීන්ත නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
8.	කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	පොලිතීන් බෑග් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තැබීම සඳහා ව්‍යාපාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
10.	විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	විකිණීම සඳහා බිම්මල් හෝ වෙනත් මල්පැළ වර්ග තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම	500 0	750 0	1,000 0
12.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
13.	ඇස් කණ්නාඩි නිපදවීමේ, විකිණීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මදුරුදැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම හා මාළු ටැංකි සෑදීම හා විකිණීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	දැන්වීම් පුවරු ඇඳීම, ප්ලාස්ටික් අංක තහඩු සැකසීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඉස්සන් හා මාළු ඇති කිරීමේ ගොවිපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	දත් කුඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
21.	තල් අමුද්‍රව්‍ය යොදා භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
22.	මුහුදු කුඩැල්ලන් සහ බෙල්ලන් එක්රැස් කිරීම හා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (E) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කල්පිටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම, එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තෙකු 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව *2019 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	300 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 16/4

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී

තීරණ අංක 5.1.1 (F) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කටයුතු ගරු අමාත්‍යතුමන් විසින් අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අංක 586 හා 1989.11.24 දිනැති ගැසට් පත්‍රය පිළිගෙන ක්‍රියාත්මක කළ යුතු බවටත්, කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, මාවතකට, කළපුවකට, මුහුදට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2020 ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තුවක් ගෙවිය යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		රු. ශත
01.	බැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා :	
I.	මාස තුනක් හෝ අඩු කාල සීමාවක් සඳහා බැනර් කටවුට් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට	20 0
II.	මාස තුනකට වැඩි හා වසර 01ක් ඇතුළත බැනර් හා කටවුට් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට	35 0
02.	ස්ථිර දැන්වීම් පුවරු ප්‍රදර්ශනය :	
	වසර 01ක කාලයක් සඳහා වර්ග අඩි 01කට	100 0
	ඊට වැඩිවන වසරක් හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩි 01කට	50 0

12 - 16/5

කල්පිටිය ප්‍රාදේශීය සභාව

වාහන නතරකර තැබීම වෙනුවෙන් ගාස්තු නියම කිරීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල අනුව කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (G) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 13 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය අනුව සභාවලට පැවරී ඇති බලතල අනුව 1988.08.23 දිනැති අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, ඉදිකිරීම් කටයුතු අමාත්‍යතුමන් විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 06 වැනි කොටසේ වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පිළිගෙන ක්‍රියාත්මක කළ යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි යම් වාහන නැවතුම් පොළක හා කල්පිටිය බල ප්‍රදේශයේ පිහිටි පහත දක්වා ඇති මාර්ගයන් හි වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනය පරිදි ගාස්තුවක් අයකළ යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

(I) නොරොච්චෝලේ ආර්ථික මධ්‍යස්ථානය සඳහා ඇතුල්වන වාහන නවතා තැබීම සඳහා -

	රු. ශත
(i) ලොරි රථයක් (ලොකු)	50 0
(ii) ත්‍රීවීලරයක්	20 0
(iii) ට්‍රැක්ටර් රථයක්	50 0
(iv) ලොරි රථයක් (පොඩි)	50 0
(v) වෑන් රථයක්	50 0

(II) කල්පිටිය නගර මධ්‍යයේ පිහිටි වාහන නැවතුම්පොළවල්, කල්පිටිය නගරයේ සිට පුත්තලම පාරේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා වූ ප්‍රධාන මාර්ගය දෙපස කල්පිටිය ජැටිය කල්පිටිය නගරයේ කරවල කඩ වීදි හා කල්පිටිය බස් නැවතුම්පොළ දක්වා දිවෙන මුතුවෙල් වීදියේ ද නවතනු ලබන වාහනයක් සඳහා නැවතුම් ගාස්තු සහ පූලච්චේන මංසන්ධියේ සිට ආලංකුඩාව මංසන්ධිය දක්වා ප්‍රධාන මාර්ගය දෙපස නවතනු ලබන වාහනයක් සඳහා නැවතුම් ගාස්තු.

	රු. ශත
1 බස් රථයක්, ලොරි රථයක්, වෑන් රථයක් නවතා තබනු ලබන පළමු පැය සඳහා	50 0
වැඩි වන සෑම පැයකටම	20 0 බැගින්
2 ත්‍රීවීලරයක්, කාර් එකක් සඳහා	
පළමු පැය සඳහා	20 0
වැඩිවන සෑම පැයකටම	10 0 බැගින්

* රාජ්‍ය ආයතන සතු වාහන නවතා තැබීම සඳහා ගාස්තු අය නොකෙරේ.

* කල්පිටිය වරිපනම් කලාපයේ පදිංචිකරුවන් විසින් මාසිකව රු. 500 0ක මුදලක් කල්පිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවා වාහන නවතා තැබීම සඳහා මාසික ප්‍රවේශපත්‍රයක් මිලදීගත හැක.

කල්පිටිය ප්‍රාදේශීය සභාව

සංචාරක වෙළඳාම පිළිබඳ ගාස්තු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (H) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල අනුව වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පනවනු ලදුව 2010.07.16 වැනි දින අංක 1662 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද 2011.04.28 වැනි දිනැති අංක 1703/18 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රයේ V (අ) කොටසේ ප්‍රකාශයට පත්කරන සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් ගාස්තු 2020 වර්ෂයට පනවා අයකළ යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *සංචාරක වෙළඳාමේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක ගාස්තුව	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක ගාස්තු*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තු*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තැඹිලි කුරුම්බා වෙළඳාම	500 0	750 0	1,000 0
2.	කඩල, වඩේ, මුරුක්කු බයිට් පැකට් විකිණීම	500 0	750 0	1,000 0
3.	රෙදි අලෙවිය	500 0	750 0	1,000 0
4.	පාවහන් අලෙවිය	500 0	750 0	1,000 0
5.	සාප්ඩු බඩු අලෙවිය	500 0	750 0	1,000 0
6.	මල් පැළ, එළවළු, පැළ හා පළතුරු පැළ අලෙවිය	500 0	750 0	1,000 0
7.	පොත්, පත්තර ද්‍රව්‍ය සැපයීම	500 0	750 0	1,000 0
8.	ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
9.	එළවළු හා පළතුරු වෙළෙඳාම	500 0	750 0	1,000 0
10.	කෘත්‍රිම මල් අලෙවිය	500 0	750 0	1,000 0
11.	ජංගම බැංකු සේවා	500 0	750 0	1,000 0
12.	පහන්තිර, හඳුන්කුරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
13.	ඔරලෝසු වෙළෙඳාම	500 0	750 0	1,000 0
14.	පාන්, බනිස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
15.	පා පැදි හා යතුරු පැදි මගින් මාළු වෙළෙඳාම	500 0	750 0	1,000 0

කල්පිටිය ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (I) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර කල්පිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කල්පිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ

(ආ) එම ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ

(ඇ) එම ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ එම ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1/3 (1/3ට) වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම විසි පහක (0.25%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර කල්පිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 16/8

කල්පිටිය ප්‍රාදේශීය සභාව

වාහන හා සත්ත්ව බදු - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වැනි වගන්තිවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (J) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වැනි වගන්තිවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II වැනි තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී වාහන හා සත්ව බද්දට යටත් සෑම තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2020 වර්ෂය සඳහාවන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

			I වැනි තීරුව	*II වැනි තීරුව*
				රු. ශත
(1)	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා		25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා —		
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්		18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්		4 0
	(iii)	සෑම කරත්තයක් සඳහා		20 0
	(v)	සෑම අත් කරත්තයක් සඳහා		10 0
	(vi)	සෑම රික්ෂෝවක් සඳහා		7 50
	(vii)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා		15 0
	(viii)	සෑම ඇතකු සඳහා		50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 16/9

කල්පිටිය ප්‍රාදේශීය සභාව

වත්කම් කුළියට දීමේදී ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (K) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභාව සතු වත්කම් කුලියට දීමේ දී 2020 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පහත සඳහන් ගාස්තුවලට අමතරව රජය විසින් පනවා ඇති බදු හෝ පැනවිය හැකි බදුවලට යටත් විය යුතුය.

අනු. අංකය		*රු. ශත*
1.	(i) මුදල් අයකරනු ලබන සංදර්ශන/සේල් පැවැත්වීම සඳහා සභාව සතු ක්‍රීඩා භූමි දීම (දිනකට)	3,000 0
	(ii) මුදල් අය කිරීමකින් තොරව පවත්වනු ලබන උත්සව හෝ වෙනත් කටයුතු සඳහා (දිනකට)	1,000 0
02.	බැකෝ ලෝඩරය මීටර් පැයක් සඳහා ඉන්ධන සහිතව	3,000 0
	* සභා භූමියේ සිට වැඩබිම දක්වා යන්ත්‍රය රැගෙන යාමේදී සහා භූමියෙන් පිටවන අවස්ථාවේදී මීටර් පැය ආරම්භ වනු ඇත. * ප්‍රමාදවීම මත සභාවට යම් අලාභයක් සිදුවීම වලක්වා ගැනීම සඳහා සභාව සමග ගිවිසුමකට එළඹිය යුතුය.	
03.	මාර්ග තලනය (මීටර් පැයක් සඳහා ඉන්ධන සහිතව)	3,650 0
	* මාර්ග තලනය වැඩ බිම දක්වා රැගෙන යාම සහ නැවත සභාව වෙත රැගෙන ඒම ගැනුම්කරු විසින් කරගත යුතුය. * වැඩ නොකර තබා ගන්නා එක් දිනක් සඳහා රු. 3,000ක මුදලක් අය කෙරේ. * කුළී ගැනුම්කරු විසින් යන්ත්‍රය සභාවට භාර දිය යුතු දිනට භාර නොදී සිටින අවස්ථාවක ප්‍රමාදවන එක් දිනක් සඳහා රු. 5,000 මුදලක් අය කෙරේ. * සභාව සමග ගිවිසුමකට එළඹ ඒ අනුව කටයුතු කළ යුතු ය.	
04.	ජල බවුසරය සඳහා ගාස්තු අය කිරීම	
	(i) එක් දිනකට ජලය සහිතව (කල්පිටිය නගර සීමාව තුළ)	3,000 0
	(ii) කල්පිටිය නගර සීමාවෙන් පිටත ස්ථානයක් සඳහා ලබා දීමේදී රු. 3,000ක මුදලට අමතරව ගමන් කරන එක් කිලෝමීටරයක් වෙනුවෙන් රු. 50ක මුදලක් අය කරනු ලැබේ.	

12 - 16/10

කල්පිටිය ප්‍රාදේශීය සභාව

සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (L) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන සේවාවන් සඳහා 2020 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවටත් කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පහත සඳහන් ගාස්තුවලට අමතරව රජය විසින් පනවා ඇති බදු හෝ පැනවිය හැකි බදුවලට යටත් විය යුතුය.

		රු. ශත
1.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු	700 0
2.	ගොඩනැගිලි අයදුම්පත්‍ර	200 0
3.	පිඹුරුපත් අනුමත කිරීම	500 0
4.	අනෙකුත් ටෙන්ඩර් පෝරම ගාස්තු	1,000 0
5.	ඉඩම් අනු බෙදුම් පෝරම ගාස්තු	200 0
6.	ගොඩනැගිලි අනුකූලතා සහතික අයදුම්පත්‍ර	200 0
7.	දේපළ අයිතිය වෙනස් කිරීම සඳහා වූ ඉල්ලුම්පත් ගාස්තු	10 0
8.	පරිසර බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු	200 0
9.	පරිසර බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	100 0
10.	පරිසර බලපත්‍ර ගාස්තු	1,250 0
11.	වෙනත් ඕනෑම සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ ගාස්තු	500 0

12 - 16/11

කල්පිටිය ප්‍රාදේශීය සභාව

තාවකාලික ප්‍රචාරක කුටි හා වෙළෙඳ කුටි සඳහා ගාස්තු අයකිරීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (M) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ප්‍රචාරණ කුටියක් පවත්වාගෙන යාම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා (1) වැනි උපලේඛනයේ සඳහන් ගාස්තු ප්‍රමාණය ද තාවකාලික වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාම සඳහා (2) වැනි උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අයකළ යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පහත සඳහන් ගාස්තුවලට අමතරව රජය විසින් පනවා ඇති බදු හෝ පැනවිය හැකි බදුවලට යටත් විය යුතුය.

1 වැනි උපලේඛනය

ප්‍රචාරක කුටි සඳහා බලපත්‍ර ගාස්තු :

1. එක් දිනකට - රු. 1,000
2. දින 7 කට - රු. 1,500
3. එක් මසකට - රු. 3,000

2 වැනි උපලේඛනය

තාවකාලික වෙළෙඳ කුටි සඳහා බලපත්‍ර ගාස්තු :		*රු. ශත*
1. වර්ග අඩි 01 සිට 10 දක්වා දිනකට	-	50 0
2. වර්ග අඩි 11 සිට 20 දක්වා දිනකට	-	100 0
3. වර්ග අඩි 21 සිට 50 දක්වා දිනකට	-	200 0
4. වර්ග අඩි 51 සිට 75 දක්වා දිනකට	-	300 0
5. වර්ග අඩි 76 සිට 100 දක්වා දිනකට	-	500 0
6. වර්ග අඩි 100 සිට වැඩිවන සෑම වර්ග අඩියක් සඳහා දිනකට	-	10 0
7. අයිස්ක්‍රීම් බයිසිකලයක් සඳහා දිනකට	-	150 0
8. අයිස්ක්‍රීම් ත්‍රිරෝද රථයක් සඳහා දිනකට	-	250 0
9. අයිස්ක්‍රීම් වෑන් රථයක් සඳහා දිනකට	-	500 0
10. පෞද්ගලික රථගාලක් සඳහා දිනකට	-	1,000 0

12 - 16/12

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ඉස්සන් ව්‍යාපාරවලින් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (N) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉස්සන් ගොවිපලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා පහත සඳහන් උපලේඛනයේ පළමු තීරුවේ සඳහන් වපසරියක් සහිත එක් එක් ඉස්සන් ටැංකි වෙනුවෙන් එම උපලේඛනයේ 2 වැනි තීරුවේ සඳහන් ගාස්තු ප්‍රමාණයක් කල්පිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

පළමු තීරුව *වපසරින්*	*දෙවන තීරුව* *රු. ශත*
අක්කර 01 දක්වා	1,000 0
අක්කර 01 ට වැඩි 03 දක්වා	3,000 0
අක්කර 03 ට වැඩි 10 දක්වා	5,000 0
අක්කර 05 ට වැඩි 10 දක්වා	10,000 0
අක්කර 10 ට වැඩි සෑම අක්කරයක් සඳහාම	500 0 බැගින්

12 - 16/13

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ලුණු ලේවායක් සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5.1.1 (O) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලුණු ලේවායක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා පහත සඳහන් උපලේඛනයේ පළමු තීරුවේ සඳහන් වපසරියක් සහිත එක් එක් ලුණු ලේවා වෙනුවෙන් එම උපලේඛනයේ 2 වැනි තීරුවේ සඳහන් ගාස්තු ප්‍රමාණයක් කල්පිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

පළමු තීරුව	*දෙවන තීරුව* *රු. ශත*
අක්කර 01 දක්වා	1,000 0
අක්කර 01ට වැඩි 05 දක්වා	2,000 0
අක්කර 05ට වැඩි 10 දක්වා	3,000 0
අක්කර 10ට වැඩි සෑම අක්කරයක් සඳහාම	500 0 බැගින්

12 - 16/14

කල්පිටිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වන වගන්තියේ IX වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් 2020 වර්ෂයට අදාළව ගාස්තුවක් අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2019 වර්ෂයෙහි ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද කල්පිටිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 5.1.1 (P) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඉන්ෆාස්,
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

යෝජනාව

1987 අංක 17 දරන සමාජ ශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ පහත උපලේඛනයේ පනවා ඇති බලපත්‍ර ගාස්තු වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයට පනවා අයකිරීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6:1:11 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
01. ඉල්ලුම් පත්‍ර ගාස්තු	100.00
02. වාර්ෂික බලපත්‍ර ගාස්තු	1,000.00

12 - 266/9

වැලිගම ප්‍රාදේශීය සභාව

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 23 අ වගන්තිය යටතේ නියමය - 2020 වර්ෂය

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ 2008.01.25 වැනි දින අංක 1533/16 දරන "*අති විශේෂ ගැසට් පත්‍රයේ* 1 කොටසේ පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශ ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කරන ලදුව එහි (ඇ) කොටසේ දක්වා ඇති නියමිත කටයුතු සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් 2020 වර්ෂයට ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන්නා වූ ක්‍රියාකාරකම් ලෙස සැලකීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6:1:12 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

1 වන උපලේඛනය

1. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (දූව පෙට්‍රෝලියම් හා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු).
2. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිදීමේ කර්මාන්ත.
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිශ්පාදනය කිරීමේ කර්මාන්ත.
5. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්.
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම් හල්.
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත.
8. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 50 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත.
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා.
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු.
14. ප්ලාස්ටික් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත.
16. උළු සහ ගඩොල් කර්මාන්ත.
17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්.
18. දිනකට ඝන මීටර් 50ට අඩු දූව ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දූව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දූව පදම් කිරීමේ කර්මාන්ත.
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දූව ආශ්‍රිත කාර්යාලය.
20. නේවාසික කාමර 05ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්.
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනිකුත් වාහන අළුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජය.
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවි කිරීම සිදුකරන ස්ථාන.

23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත.
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

12 - 266/10

වැලිගම ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2020 වර්ෂයට පනවා අයකිරීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6:1:13 යටතේ සභාව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා,	25 00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	
(අ) වෙළෙඳ කාර්යක් සඳහා යොදවන්නේ නම්	18 00
(ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4 00
සෑම කරත්තයක් සඳහා	20 00
සෑම අත් කරත්තයක් සඳහා	10 00

12 - 266/11

වැලිගම ප්‍රාදේශීය සභාව

තාවකාලික වෙළෙඳසල් බදු පැනවීම - 2020 වර්ෂය

උත්සව අවස්ථා සඳහා තාවකාලික වෙළෙඳ සැල්වලින් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන් පරිදි බද්දක් 2020 වර්ෂයට පනවා අයකිරීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6 :1:14 යටතේ සභාව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු.ශත
01	භූමියේ වර්ග අඩියක් සඳහා	50.00
02	අයිස් ක්‍රීම් වෑන් රථයකින් දිනකට (උත්සව අවස්ථාවක දී)	500.00
03	අයිස්ක්‍රීම් බයිසිකලයකින් දිනකට	300 00
04	ජංගම වෙළෙදාම් කඩල/රසකැවිලි සඳහා	500 00
05	පෞද්ගලික රථ ගාල් සඳහා	1,000 00
06	පා පැදි හා යතුරු පැදි ආරක්ෂා කරන ස්ථාන සඳහා	500 00
07	ක්‍රීඩා භූමි/පොදු වෙළෙඳ පොළවල් භූමි (රැස්වීම් සඳහා බදු දීම දිනකට)	1,000 00

12 - 266/12

වැලිගම ප්‍රාදේශීය සභාව

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ පනත යටතේ ගාස්තු අයකිරීම - 2020 වර්ෂය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ පනත යටතේ අංක 1597/8 හා 2009.04.17 වැනි දින ගැසට් පත්‍රයට අනුව 2020 වර්ෂයට ගාස්තු අයකිරීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6:1:15 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 266/13

වැලිගම ප්‍රාදේශීය සභාව

ආකෘති පත්‍ර හා සේවා සඳහා ගාස්තු අය කිරීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර නිකුත් කරනු ලබන සහතික හා සේවා සඳහා මෙහි පහත සඳහන් ගාස්තු 2020 වර්ෂයට පනවා අය කිරීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6:1:16 යටතේ සභාව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු.ශත
1.	දුරකතන කුළුනක් ස්ථාපිත කිරීම සඳහා	පෙරසැරි ගාස්තු
2.	බැකෝ යන්ත්‍රය පැය 1 සඳහා (බදු රහිතව)	2,200.00
3.	ස්කැවේටර් යන්ත්‍රය පැය 1 සඳහා (බදු රහිතව)	1,800.00
4.	කොන්ක්‍රීට් මිශ්‍රණය දිනකට (බදු රහිතව)	2,000 0
5.	පොළව තලන තහඩුව (කම්පන තහඩුව) (බදු රහිතව)	1,500 0
6.	ගලි බවුසරය බල ප්‍රදේශය තුළ (බදු රහිතව)	5,000 0
7.	ගලි බවුසරය බල ප්‍රදේශයෙන් පිටත ගාස්තු (රු.5,000) සහ (කිලෝමීටර් 1 කට)	100 0
8.	දේශන ශාලාව බදු දීම	4,000 0
9.	අනතුරුදායක ගස් ඉවත්කිරීමේ අයදුම්පත සඳහා -	
1.	කොස් ගසක් කැපීම සඳහා අයදුම්පත් ගාස්තු	500 0
2.	ඊට වැඩිවන සෑම ගසක් සඳහාම	150 0
3.	පොල් ගසක් කැපීම සඳහා අයදුම්පත් ගාස්තු	200 0
4.	ඊට වැඩිවන සෑම ගසක් සඳහාම	100 0
5.	අනිකුත් ගසක් කැපීම සඳහා අයදුම්පත් ගාස්තු	250 0
6.	එක් ගසකට වැඩිවන සෑම ගසක් සඳහාම	100 0
10.	ගොඩනැගිලි අයදුම්පතක් සඳහා (නේවාසික භාවිතය)	500 0
11.	ගොඩනැගිලි අයදුම්පතක් සඳහා (වානිජ භාවිතය)	2,000 0
12.	පරිසර ආරක්ෂණ බලපත්‍ර අයදුම්පතක් සඳහා	1,000 0
13.	පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ අයදුම්පතක් සඳහා	500 0
14.	අනුබෙදුම් අයදුම්පතක් සඳහා (නේවාසික)	500 0
15.	අනුබෙදුම් අයදුම්පතක් සඳහා (වාණිජ)	1,000 0
16.	ගොඩනැගිලි සැලසුමක් දීර්ඝ කිරීම සඳහා(එක් වසරකට)	500 0
17.	අනුකූලතා සහතිකයක් සඳහා	(වර්ග අඩි ප්‍රමාණය අනුව) -
18.	වීථි රේඛා නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා	500 0
19.	ජල සහතිකයක් සඳහා	150 0
20.	විදුලි සහතිකයක් සඳහා	150 0
21.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පතක් සඳහා	250 0
22.	1987 පෙර ඉදිකරන ලද ගොඩනැගිල්ලක් බවට සහතිකය ලබා දීම සඳහා	1,000 0

වැලිගම ප්‍රාදේශීය සභාව

කැලි කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221(ආ), 122, 126 වැනි වගන්තිවලින් මා වෙත පැවරීඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 *අති විශේෂ ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කරන ලදුව 2014.12.19 වැනි දින අංක 1894 දරන *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ නිවේදනයක් මගින් වැලිගම ප්‍රදේශීය සභාව විසින් පිළිගෙන වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි 9 වැනි කොටසේ කසළ ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර වැලිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ස්ථානයක කැලි කසළ ඉවත් කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2020 වර්ෂයට පනවා අය කිරීමට 2019 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වනු ලැබූ මාසික සභාවේ සභා තීරණ අංක 6:1:17 යටතේ සභාව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙකී ගාස්තුව සෑම මසකම 10 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතුයි, මෙයට අමතරව රජය විසින් පනවා ඇති ජාතිය ගොඩනැගීමේ බද්ද ද (මුදල් ගෙවන දිනය නිවාඩු දිනයක් වුවහොත් ඊට පෙර දින අදළ ගෙවීම් කළ යුතුය) ගෙවිය යුතු බව ද මෙයින් දැනුම් දෙමි.

දයා පුෂ්ප කුමාර හේවා බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
වැලිගම ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	මාසයක් සඳහා *රු. ශත*
සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි සංචාරක නිකේතනවලින් 1% බලපත්‍ර ගාස්තු, වරිපනම් ගාස්තු සහ බදු ගාස්තු දෙකම ගෙවන ආයතනවල කසළ ගාස්තු	3,000 0
සංචාරක නිවාසයක (නවාතැන්පළක්) කාමර සංඛ්‍යාව 01-05 අතර නම්	3,000 0
සංචාරක නිවාසයක (නවාතැන්පලක්) කාමර සංඛ්‍යාව 06-10 අතර නම්	5,000 0
සංචාරක නිවාසයක (නවාතැන්පලක්) කාමර සංඛ්‍යාව 11 - 15 අතර නම්	7,500 0
සංචාරක නිවාසයක (නවාතැන්පලක්) කාමර සංඛ්‍යාව 16 - 20 අතර නම්	10,000 0
සංචාරක නිවාසයක (නවාතැන්පලක්) කාමර සංඛ්‍යාව 21 - 25 අතර නම්	12,500 0
සංචාරක නිවාසයක (නවාතැන්පලක්) කාමර සංඛ්‍යාව 25ට වැඩි නම්	15,000 0
කර්මාන්ත ශාලාවක	10,000 0
ආපන ශාලාවක	5,000 0
කර්මාන්ත ශාලාවක්/ආපනශාලාවක් නොවන වෙනත් ව්‍යාපාරික ස්ථානයක	3,000 0
වරිපනම් බදු අය නොකරන නේවාසික ස්ථානයකින්	1,000 0

මොරටුව මහ නගර සභාව

2020 වර්ෂයට බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1947 අංක 29 දරන මහ නගර සභා ආඥා පනතින් මොරටුව මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019.11.07 වැනි දින මාසික සභා රැස්වීමේදී පනවන ලද අංක 6 (9) 23 යටතේ පහත සඳහන් යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. 2020 වර්ෂය සඳහා බදු/බලපත්‍ර ගාස්තු 2020 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති,
මොරටුව මහ නගර සභාව.

2019 නොවැම්බර් මස 20 වැනි දින,
මොරටුව මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1979 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය 247) "අ", "ආ", "ඇ", "ඉ", ප්‍රකාරව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන්ම උපලේඛන අංක I, II, III, IV, V, VI, VII සඳහන් බලපත්‍ර ගාස්තුවක්/බද්දක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරන්නීය.

2020 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

උපලේඛනය - අංක I

2020 වර්ෂයට බලපත්‍ර ගාස්තු අය කිරීම - 247 (අ) වගන්තිය

බලපත්‍ර ගාස්තු වක්‍රය :

ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම	*බලපත්‍ර ගාස්තු* රු. ශත.
රු. 100 - රු.6,500	700 0
රු. 6,501 - රු. 10,000	1,500 0
රු. 10,001 - රු. 25,000	3,000 0
රු. 25,000 ට වැඩි	5,000 0

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.

අනු. අංකය	*වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය*
1.	හෝටලයක් පවත්වාගෙන යාම
2.	ඌරන් හෝ එළුවන් දහයක් හෝ ඊට වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පවත්වාගෙන යාම
3.	උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4.	විෂබීජ නාශක නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
5.	ටයර් නැවත පිරවීමේ හෝ කට්ට කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
6.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම
9.	රබර් භාණ්ඩ නිෂ්පාදනය හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10.	පොලිතින් සැලෝලයිට් හෝ පර්ස්පෙක්ට් නිෂ්පාදනය හෝ වර්ග කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11.	පොල්තෙල් ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12.	රෙදි නිෂ්පාදනය හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය
13.	රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14.	ලී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16.	ගැල්වනයිස් තහඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17.	රූපලාවන්‍ය හෝ මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18.	කේටරින් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19.	ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම
20.	සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම
21.	තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22.	විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
23.	යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම (ඇඟළුම් කර්මාන්තශාලාව)
24.	තේ කඩයක් පවත්වාගෙන යාම
25.	බතික් රෙදි නිෂ්පාදනය කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26.	රෙදි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27.	විදුරු භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28.	තේ ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29.	ගබඩාවක් පවත්වාගෙන යාම
30.	සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31.	විනාකිරි නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32.	වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම
33.	ෆයිබර් ග්ලාස් බෝට්ටු හා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34.	ගෙබිම පොලිෂ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35.	පොලිෆෝම් කුෂන් නිෂ්පාදනය/ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36.	ෆ්ලාස්ටර් ඔෆ් ෆැරිස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37.	රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38.	සයිලන්සර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39.	සමාජ ශාලාවක් පවත්වාගෙන යාම
40.	රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
42.	ලේත් මැෂින් වැඩපල
43.	සුපිරි වෙළඳ සංකීර්ණය තුළ ෆාමසියක් පවත්වාගෙන යාම
44.	සිනමාශාලාවක් පවත්වාගෙන යාම
45.	විදුලි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46.	බීම පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47.	විදුලි නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48.	නූල් නිපදවීමේ හා වර්ණ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49.	ඉලාස්ටික් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50.	රේස් බයි රේස් ස්ථානයක් පවත්වාගෙන යාම
51.	බෝල මේසයක් පවත්වාගෙන යාම (බිලියට්)
52.	ඇස් කණ්නාඩි නිෂ්පාදනය හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53.	සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54.	එසෙන්ස් වර්ග නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55.	කිරිහලක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
56.	දන්ත සායනයක් පවත්වාගෙන යාම
57.	සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
58.	ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
59.	බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
60.	පොලිතීන් පටල නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය
61.	ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62.	නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම
63.	බේකරියක් පවත්වාගෙන යාම
64.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම
65.	ජලය පිරිසිදු කර බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66.	වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, ලී පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67.	මහාපරිමාණයේ වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
68.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන ලී මෝලක් පවත්වාගෙන යාම
69.	බැන්සෝ එකක් සඳහා (හැඩ කපන)
70.	ගෘහ භාණ්ඩ පොලිෂ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
71.	රාමු කියත් (වෙහෙරාන්)
72.	පැන්ට්‍රි කබඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73.	ඉරූ දැව සහිත ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම
74.	දැව කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75.	ලී ගෘහ භණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76.	මෙයට සාමගාමීව වඩු මඩු සඳහා බලපත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි 2020 වර්ෂය සඳහා අය කරනු ලැබේ.

	ගාස්තුව රු. ශත
වඩු මඩුව මෝටර් රහිත	250 00
වඩු මඩුව මෝටර් 01	275 00
වඩු මුඩව මෝටර් 02	300 00
වඩු මඩුව මෝටර් 03	325 00
වඩු මඩුව මෝටර් 03 ට වැඩි	700 00
වඩු මඩුවක් බැන්ඕ එකක් සමග පවත්වාගෙන යාම	1,000 00
අත්බංකු රෝද කියත් රෝල බංකු රෝද කියත්	3,000 00

77. ශීතකළ මස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හෝ මස් වෙළඳාම

I ශීතකළ මස් සහ ශීතකළ කුකුල් මස් අලෙවිකරණ ව්‍යාපාර සඳහා සඳහා රු. 10,000.00
II මස් සහ ශීතකළ මස් (සියළුම මස් වර්ග) අලෙවි කරන ව්‍යාපාර සඳහා රු. 15,000.00
III මස් සහ ශීතකළ මස් (සියළුම මස් වර්ග) අලෙවි කරන යෙදවුම් පිරිවැය මිලියන 4කට වැඩි ව්‍යාපාර සඳහා රු. 50,000.00
IV සුපිරි වෙළඳ සැල් ලෙස මහා නගර සභාවේ වෙළඳ බලපත්‍රය ලබා ගැනීමේදී ලියාපදිංචි වී ඇති වෙළෙඳ සැල් සඳහා රු. 100,000.00
V සුළු සිල්ලර ව්‍යාපාර - ඉහත වර්ගීකරනයන්ට අදාළ නොවන මාංශ හා මාංශ නිෂ්පාදනය අලෙවිකරන වෙළෙඳ ව්‍යාපාර සඳහා රු. 5,000.00

යෙදෙවුම් පිරිවැය මස් හා ශීත කළ මස් විකිණීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පිරිවැය හා ඒ සඳහා යොදා ගන්නා භාණ්ඩ හා උපකරණ (ශීතකරණ, අධිශීතකරණ, තරාදි ආදී දේ) පිරිවැය ලෙස අදහස් කෙරේ.

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම
2 මිනිරන් ගබඩා කර තැබීම

3 පොහොර නිෂ්පාදනය
4 පොහොර ගබඩා කර තැබීම
5 හම් ගබඩාකර තැබීම
6 උම්බලකඩ හොඬඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
7 කුකුළු වෙළඳපොළක් පවත්වාගෙන යාම
8 කලුගල් කැඩීම සහ කබොක් කැපීම
9 බොරලු හැරීම
10 අශ්වයින් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළඳපළක්, ගාළක් හෝ ලැයිමක් තබා ගැනීම
11 පශු ගිලන් හලක් පවත්වාගෙන යාම
12 රබර් සකස් කිරීම
13 පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත් වැඩියා කිරීම, හෝ ඒවායේ දූලි ඉවත් කිරීම.
14 පුවක් සකස් කිරීම
15 තලාතු මිනිරන් සකස් කිරීම
16 බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
17 උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
18 හුණු ගබඩා කොට තැබීම
19 බොම්බයි ලූනු හොඬඩර 5 කට වඩා ගබඩා කොට තැබීම
20 අර්තාපල් හොඬඩර 5 කට වඩා ගබඩා කොට තැබීම
21 පොල්කටු අඟුරු හොඬඩරයකට වඩා ගබඩා කොට තැබීම
22 කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම
23 පරණ ලෝහ ගබඩා කර තැබීම
24 සිමෙන්ති හොඬඩර 25 කට වඩා ගබඩා කොට තැබීම
25 කරවල හොඬඩර 10 කට වඩා ගබඩා කොට තැබීම
26 ලුණු දැමූ මාළු හොඬඩර 10 කට වඩා ගබඩා කොට තැබීම
27 රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම
28 ට්‍රාන්ක් පෙට්ටි නිෂ්පාදනය
29 මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
30 ගම් වර්ග නිෂ්පාදනය
31 විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
32 බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙයන යාම
33 ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නාවූ හෝ කට්ට කැපීම කරනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම
34 ටයර් හෝ ට්‍යුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
35 හිස් බෝතල් 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
36 කුරුඳු පොතු හොඬඩරයකට වඩා ගබඩා කොට තැබීම
37 කොකෝවා හොඬඩර 10කට වඩා ගබඩා කොට තැබීම
38 මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම
39 ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම
40 මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම
41 බලපත්‍ර ලත් වෙළන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම
42 වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම
43 කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම
44 යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
45 පිටි හෝ කුළුබඩු ඇඹරීම
46 පුන්නක්කු හැර, සක්ත්ව ආහාර හොඬඩර 20 කට වඩා ගබඩා කොට තැබීම සත්ව ආහාර සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිති විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
47 රබර් භාණ්ඩ නිෂ්පාදනය
48 මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම
49 යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම
50 පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම

51 පොලිතීන්, සෙලූලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, නිපදවීම සහ ගබඩා කර තැබීම
52 ඇසිඩ් ගැලුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
53 කපුරු නිෂ්පාදනය
54 බුට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය
55 ඉටිපන්දම් නිෂ්පාදනය

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
2 සිසිල් බීම නිෂ්පාදනය
3 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
4 යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
5 යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
6 තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම
7 කෙදි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම
8 ගිනි පෙට්ටි නිෂ්පාදනය
9 ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම
10 පොල්තෙල් ගැලුම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
11 මැතිලේටඩ් ස්ප්‍රිතු ගබඩා කොට තැබීම
12 ඇසිටිලින් නිෂ්පාදනය
13 උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
14 ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
15 කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
16 සිගරට් නිෂ්පාදනය
17 බීඩී නිෂ්පාදනය
18 තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
19 ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
20 කොහු නිෂ්පාදනය
21 පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි හැර වෙනත් ගෝනි 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
22 පාවිච්චිකළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
23 රසකැවිලි නිෂ්පාදනය
24 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
25 බෝට්ටු හෝ බත්තල් සෑදීම
26 ලී පෙට්ටි සෑදීම
27 ඔක්සිජන් සහ වෑල්ඩින් වැඩ කරනු ලබන්නාවූ මෝටර් වාහන අලුත් වැඩියා කරන්නාවුද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
28 මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
29 මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම
30 මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
31 යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නාවූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
32 අතින් හෝ පා පොලු වලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
33 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම
34 පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
35 ගෙන්දගම් සහ/ හෝ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
36 තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය

37 100කට අධික ප්‍රමාණයක් පතුරොම් ගබඩා කර තැබීම
38 කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/ හෝ ගබඩා කර තැබීම
39 අලුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
40 පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම
41 ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
42 යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
43 යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නාවූ ද ඇඳුම් මැසීම කරනු ලබන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම
44 කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා, අන්තරාදායක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම
2 යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන්නාවූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
3 යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නාවූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩකරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම
4 ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම
5 කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය
6 අශුද්ධ ලෝහ උණු කිරීම
7 ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම
8 කිලෝග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම
9 ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම
10 බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය
11 තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
12 ශීතරකණ අලුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
13 මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
14 ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
15 පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

බලපත්‍රය නිකුත්කර ඇත්තේ යම් ව්‍යාපාරයක් සඳහා ද ඒ ව්‍යාපාරය හැර වෙනත් කිසිම ව්‍යාපාරයක්, බලපත්‍රලත් ස්ථානයෙහි පවත්වාගෙන යාමට කිසිම බලපත්‍රලාභියකු විසින් ඉඩ නොදිය යුතු ය.

ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා,අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 රබර් නිවාරණය කිරීම
2 පෝර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම
3 තලාතු මිනිරන් නිවාරණය කිරීම
4 හුණු ගබඩා කිරීම
5 කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් පොල්කටු අඟුරු ගබඩා කිරීම
6 ගෙන්දගම් දුම් භාවිතා කරමින් කුරුඳු, කරදමුංගු හෝ කෙඳි නිවාරණය කිරීම
7 ඔට්ටුපාල ඇඹරීම හෝ චේලීම
8 බැටරිචාර්ජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන, යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
9 ටියුබ් හෝ ටයර් වොල්කනයිස් කරන, යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
10 කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම
11 කිලෝග්‍රෑම් 500ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම
12 මිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම

13 දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14 බලපත්‍රය ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කිරීම
15 වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
16 යාන්ත්‍රික බලය භාවිතා කරන්නාවූ රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම
17 පිටි හෝ තුනපහ වර්ග කෙටීම
18 රබර් බඩු නිෂ්පාදනය කිරීම
19 දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
20 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
21 යාන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
22 යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
23 තෙල් සිදීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරවන මෝලක් පවත්වාගෙන යාම
24 කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
25 ගිනිපෙට්ටි නිෂ්පාදනය
26 පුළුන් ගබඩා කිරීම
27 ලීටර් 227 1/2 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම
28 මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම
29 ඇසිටිලින් නිෂ්පාදනය
30 සිගරට් නිෂ්පාදනය
31 බීඩි නිෂ්පාදනය
32 කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීම
33 කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම
34 කොහු නිෂ්පාදනය
35 රසකැවිලි නිෂ්පාදනය
36 පෝර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර, කිලෝග්‍රෑම් 100ට වැඩියෙන් වෙනත් ගෝනි මළු ගබඩා කිරීම
37 පාවිච්චි කළ රබර් ටයර්, හෝ ටියුබ් 150 ට වැඩියෙන් ගබඩා කිරීම
38 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් ගබඩා කිරීම
39 ලී පෙට්ටි නිෂ්පාදනය
40 යාන්ත්‍රික බලය පාවිච්චි කරන, ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
41 යාන්ත්‍රික බලය පාවිච්චි කරන, යකඩ හෝ ලෝහ වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
42 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන අළුත්වැඩියා කරන හෝ සර්විස් කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
43 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන හෝ අළුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම
44 යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
45 අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
46 පරණ ඇඳුම් ගබඩා කිරීම
47 ලීටර් 54 ට වැඩියෙන් පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ගබඩා කිරීම පිණිස අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
48 ඇඳුම් ඩ්‍රයික්ලීන් කරන ආයතනයක් පවත්වාගෙන යාම
49 යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන විද්‍යුත් ලෝහාලේපන කිරීම, ක්‍රොමියන් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය
50 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලේපනය කිරීම, ක්‍රෙමියම් ආලේපනය කිරීම
51 මෝටර් වාහන අළුත්වැඩියා කරන ගරාජයක් සහ ආර්ක් වේල්ඩිං වැඩ කිරීම
52 කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිත කෙරෙන යම් ස්ථානයක් පවත්වාගෙන යාම
53 කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම
54 සියලු වර්ගයේ ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය කිරීම
55 කිලෝග්‍රෑම්ස් 50ට වැඩියෙන් කවර හෝ වර්ගයක පොලිතින් බඩු තබා ගැනීම
56 සියලු වර්ගවල පොලිතින් බඩු නිෂ්පාදනය කිරීම

57 කොහු නිෂ්පාදනය හා තබා ගැනීම
58 කිලෝග්‍රෑම්ස් 1000ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම
59 කිලෝග්‍රෑම්ස් 250ට වැඩියෙන් කඩදාසි සහ/ හෝ කවර වර්ගයක හෝ කඩදාසි බඩු ගබඩා කිරීම
60 ඇඟළුම් නිෂ්පාදනය
61 බත් කඩ
62 රසායන ද්‍රව්‍ය
63 කිලෝග්‍රෑම් 50ට වැඩි සියලු වර්ගවල ගිණිකෙලි භාණ්ඩ තබා ගැනීම
64 කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් එල්.පී.ජී.(LP.G) සිලින්ඩර් ගබඩා කිරීම
65 හිස් වැසුම් සහ තොප්පි නිෂ්පාදනය
66 කිලෝග්‍රෑම්ස් 100 ට වැඩියෙන් රබර් බඩු (සියලු වර්ගවල) ගබඩා කිරීම
67 කිලෝග්‍රෑම්ස් 250 ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම
68 කිලෝග්‍රෑම්ස් 250 ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම
69 ලීටර් 91 ට වැඩියෙන් ඇසිඩ් ගබඩා කිරීම
70 එකවරකට සේවානියුක්තිකයින් 25 ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
71 ද්‍රව ඛණිජ තෙල් ගෑස් ඇතුළුව ඛණිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම
72 පතරොම් සහ වෙඩි බෙහෙත්

1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ඇත්තාවූ හෝටලයක, ආපන ශාලාවක හෝ නවාතැන් පොළක පෙර වර්ෂයේ සියලු ලැබීම් මත 01%ක ගාස්තුවක් බලපත්‍ර ගාස්තු ලෙස අයකරනු ලැබේ.

අදාළ වර්ෂයේ ජූනි මස 30ට පෙර බලපත්‍රය ලබාගත යුතු ය.

උපලේඛනය - අංක II

කර්මාන්ත විෂයෙහි බදු අය කිරීම - 247 (ආ) වගන්තිය

බදු ගාස්තු වක්‍රය :

ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම	*අයකල යුතු මුදල් බදු මුදල් රු. ශත*
රු. 100 - රු.6,500	700.00
රු. 6,501 - රු.10,000	1,500.00
රු. 10,001 - රු.25,000	3,000.00
රු.25,000 ට වැඩි	5,000.00

අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*
1	සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම
2	රෙදිපිළි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3	විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
4	විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
5	මෝටර් රථ අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
6	ශීතකරණ විකිණීමේ හෝ ආනයනය කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7	රූපවාහිනි විකිණීමේ හෝ ආනයනය කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8	වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9	කමිස, කරපටි හා කමිස අත් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10	බටහිර ඖෂධ වර්ග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
11	ධාන්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
12	පරිගණක එම්බ්‍රොයිඩර් කර්මාන්තයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
13	සපත්තු ලේස්, කෝඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14	පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15	මෝටර් සයිකල් හෝ ස්කූටර් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16	චීන චට්ටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17	පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18	පාවහන් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19	සම් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20	ඉලෙක්ට්‍රෝනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21	ආහාර පිසීම සඳහා ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22	වාහන ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23	දිවා සුරාකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24	බීඩි, සුරුට්ටු, සිගරට් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25	පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ස්වයං රැකියා)
26	මැණික් කැපීමේ හා පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27	ඉවතලන නූල් හා ජුට් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28	අපනයන හෝ ආනයන කිරීමේ වැඩ කටයුතු සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
29	දර මඩුවක් පවත්වාගෙන යාම
30	නූල් නිෂ්පාදනය කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31	ග්‍රොසරියක් පවත්වාගෙන යාම
32	මහන මැෂින් ගෙන්වීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33	පරිගණක යන්ත්‍ර ගෙන්වීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34	පුටු විවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
35	ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36	යකඩ බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37	තොග වශයෙන් සීනි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38	ශබ්ද විකාශන යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39	අලුත් ටයර් ටියුබ් හා පුරවන ලද ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40	පරණ ටයර් ටියුබ් හා පුරවන ලද ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41	ප්‍රචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම
42	සිගරට් වෙළඳාම් කිරීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම
43	මසා නිමකළ ඇඳුම් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44	වානිජමය කාර්යයන් සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම
45	ඔරලෝසු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46	විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
47	ගෘහ උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48	සුරතලය සඳහා ඇතිකරන මසුන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49	සුපිරි වෙළඳ සංකීර්ණය තුළ මුල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
50	විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
51	නියෝජිත (ඒජන්සි) තැපැල් හලක් පවත්වාගෙන යාම
52	වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53	ආයුර්වේද ඖෂධ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54	පොත්පත් හා ලිපිද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55	අකුරු කෙටීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
56	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
57	බුමුතුරුණු හා ෆෝමිකා ෂීට් විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58	කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59	ලාම්පු ආවරණ නිෂ්පාදනය හෝ විකිණීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
60	තොග වශයෙන් පිටි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61	විෂබීජනාශක ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62	බීජ වර්ග හා පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63	සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම
64	ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65	බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66	ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67	උත්සව සඳහා භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68	දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
69	ගුවන්විදුලි අමතර කොටස් වෙළඳාම් හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70	පිඟන් බඩු වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71	තෑගි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72	දැන්වීම් පුවරු සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
73	උත්සවශාලාවක් පවත්වාගෙන යාම
74	විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76	සැනැප් කඩදාසි හෝ පරණ කඩදාසි බෝතල්, ගෝනි, පරණ යකඩ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77	කුෂන් මෙට්ට හා කුෂන් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78	ගොඩනැගිලි ද්‍රව්‍ය, නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79	කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80	කෞතුක භාණ්ඩ වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81	තොග වශයෙන් වෙළඳාම් සඳහා දියලුණු ගබඩා කිරීම හෝ ලුණු කුඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82	මල් ශාලාවක් පවත්වාගෙන යාම (ස්වභාවික)
83	කෘතිම මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84	අවමංගල්‍ය භාණ්ඩ වෙළඳාම හා කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85	අත්යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86	වීඩියෝ කැසට්පට හෝ වීසීඩී තැටි වෙළඳාම හෝ කුළියට දීමේ, පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87	පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88	හඳුන්කුරු නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89	සංගීත භාණ්ඩ වෙළඳාම හා කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90	පුවත්පත් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91	හිස් බැරල් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92	බැංකුවක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු.5,000ක් බැගින් ගාස්තුවක් අය කිරීම I. ස්ථාවර හෝ ඉතිරිකිරීමේ ගිණුම් පැවැත්වීම II. ජංගම ගිණුම් පැවැත්වීම III. ක්ෂණිකව මුදල් ලබා ගැනීමේ කවුළුවක් පැවැත්වීම IV. රන් භාණ්ඩ උකස් ගැනීම V. වෙන්දේසි කටයුතු කිරීම VI. විදේශ මුදල් මාරු කිරීම
93	රක්ෂණ ආයතනයක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000ක් බැගින් ගාස්තුවක් අය කිරීම I. ජීවිත රක්ෂණය II. දේපළ රක්ෂණය III. රථවාහන රක්ෂණය
94	ෆිනෑන්ස් ආයතනයක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000ක් බැගින් ගාස්තුවක් අය කිරීම I. දේපළ මිලට ගැනීම II. දේපළ විකිණීම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
III.	පාරිභෝගික තැන්පත් ගිණුම් පැවැත්වීම
IV.	බදු ඔප්පු යටතේ ණය නිකුත් කිරීම
V.	රන් භාණ්ඩ උකස් ගැනීම
95	බිත්තර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96	සිහිවටන නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98	පැණි ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99	ප්‍රචාරක දැන්වීම් අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100	විදුලි කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම
101	පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
102	ආයුර්වේද ඖෂධ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සිල්ලරට ස්වයං රැකියා හැර)
103	ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
104	කුලියට ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
105	බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106	හැලි වලං හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
107	පළතුරු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109	කඩල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110	එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111	රබර් සීල් හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112	කුඩ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113	මල් පෝච්චි හෝ විවිධ මල්පැල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114	පිත්තල භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115	කම්හල් වැඩපලක් පවත්වාගෙන යාම
116	පරිගණක යන්ත්‍ර පිළිබඳ පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
117	ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් ආයතනයක් පවත්වාගෙන යාම
118	රිය පැදවීම පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
119	හාල් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
120	ස්වර්ණාභරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121	යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122	කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
123	බුලත්, ලනු, පැදුරු, වලං, සුළු සාප්පු බඩු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
124	පුවත්පත් ඒජන්සියක් පවත්වාගෙන යාම
125	නල ලිං ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
126	කරවල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
127	ඇලුමිනියම්, ප්ලාස්ටික්, ලෝහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
128	යතුරුපැදි හා ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
129	පරණ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
130	සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
131	ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
132	රථ අංගනයක් පවත්වාගෙන යාම
133	කර්මාන්තශාලා විද්‍යුත් විදුලි උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
134	මහන මැෂින් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
135	මහන මැෂින් අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
136	රෙදිපිළි ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
137	යකඩ හා වානේ වැඩපලක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
138	විදුලි බල මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
139	කැබ් සර්විස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
140	රථ වාහන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
141	පෝලිෆෝම් කුෂන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
142	මෝටර් සයිකල් හෝ ස්කූටර් එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
143	බීඩිං, මෝල්ඩිං පටි නිෂ්පාදනය/ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
144	ෆෝමිකා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
145	තුනී ලෑලි (MDF) කර්මාන්තය, වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
146	රේස්බුකි (රේස් ඔට්ටුපල) ස්ථානයක් පවත්වාගෙන යාම
147	බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
148	ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
149	පෙර පාසලක් පවත්වාගෙන යාම
150	ක්‍රීඩා පුහුණු ඒකකයක් පවත්වාගෙන යාම
151	ජ්‍යොතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම
152	අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් රෙදි විවීම
153	පුද්ගලික රෝහලක් හෝ සාත්තු නිවාසයක් පවත්වාගෙන යාම
154	යතුරුපැදි අමතර කොටස් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
155	වතුර බව්සර් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
156	වාහන විදුලි කර්මාන්ත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
157	කාඩ්බෝඩ් ඇසුරුම් හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
158	ඡායාරූප උපකරණ වෙළෙඳාම හා අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
159	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
160	ඡායාරූප මුද්‍රණය කිරීමේ ස්ථානයක් (කලර් ලැබ්) පවත්වාගෙන යාම
161	වේවැල් භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
162	සෙලියුලර් දුරකථන වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
163	පා පැදි අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
164	දුරකථන එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
165	මැණික් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
166	බඩු උකස් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
167	පෞද්ගලික උපකාරක පන්ති පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
168	බලයලත් මත්පැන් විකිණීමේ හා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
169	බීර, වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
170	දුරකථන සංඥ කුළුනක් පවත්වාගෙන යාම

තක්සේරු නොවූ දේපළ සඳහා මහ නගර සභාවේ ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරුව මත බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුය. කර්මාන්ත විෂයෙහි බදු ගෙවිය යුතුය.

උපලේඛන අංක III

වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් බද්ද - 247 (ඇ) වගන්තිය

(අ) බදු චක්‍රය

වෙළෙඳ ව්‍යාපාරයේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලට අනුව පහත සඳහන් පරිදි ගාස්තු අය කෙරේ.

වෙළඳ ව්‍යාපාරයේ ලැබීම් :

රු.	*රු.*	*ගාස්තුව රු. ශත*
6,000 දක්වා	-	නැත
6,001	12,000	100 00

රු.	*රු.*	*ගාස්තුව* *රු. ශත*
12,001	18,750	180 00
18,751	75,000	360 00
75,001	150,000	1,200 00
150,000 ට වැඩි	-	3,000 00

(ආ) ව්‍යාපාර ලැයිස්තුව :

(ඒ) වෘත්තීය රැකියා පුහුණුව හෝ කැඳවීම

කොමිස් ඒජන්තවරු
ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
මුදල් ණයට දෙන්නෝ
බ්‍රෝකර්වරුන්
වෙන්දේසිකරුවන්
මුදල් ආයෝජකයන්
පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වන්නන්
ගෘහ නිර්මාණ ශිල්පීන්
ප්‍රචාරක දැන්වීම් උපදේශක
ජීවිත සහතික පිළිබඳ ගණන් තැබීමේ හා සකස් කිරීමේ විශේෂඥයා
පාරිසරික උපදේශක ආයතන
පෞද්ගලික ආරෝග්‍යශාලාවක් පවත්වාගෙන යාම
ආයෝජන උපදේශක
ශරීරාවයවයන් හි ක්‍රියා කිරීම පිළිබඳ චිකිත්සක
මිනින්දෝරු/ බිම සමතලාකරු
අයබදු උපදේශක
සත්ව සායන ආයතනයක් පවත්වාගෙන යාම
ඉහත සඳහන් කර නොමැති වෘත්තීය රැකියා පුහුණුවක් හෝ රැකියාවට කැඳවීම

(බී) **ව්‍යාපාරය**

ප්‍රචාරක දැන්වීම් නියෝජිත ධුරය
නියෝජිත ධුර ආයතනය
නැව් බඩු බැහැර කිරීමේ සේවාව
ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිත ආයතනය
මුදල් ආයෝජන ආයතනයන් පවත්වාගෙන යාම
පරිගණක පුහුණු ආයතන
පරිගණක පුහුණු සේවාව
ප්‍රවහන සේවා ආයතනයක් පවත්වාගෙන යාම
ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
විදේශ සේවා රැකියා ආයතනයක් පවත්වාගෙන යාම
චැනල් කිරීමේ ව්‍යාපාරික සේවාව
ඇඳුම් සැකසීමේ පාසල
නැටුම් පාසල
රියැදුරු පාසල
රැකියා නියෝජිත ධුරය
ගාස්තු අයකරන පාසල
ඇතුළත අලංකාර කරන්නන්
ජලය විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
රසායනාගාර සේවාවක් පවත්වාගෙන යාම

බඩු/ මිටි/ ලියකියවිලි එහා මෙහා ගෙන යන්නන්
මෝටර් රථ කුලියට දීම හා බදු දීම
කන්ටේනර් අංගනයක් පවත්වාගෙන යාම
ප්‍රවහන අංගනයක් පවත්වාගෙන යාම

උපලේඛන අංක IV

මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරියේ 247 ඈ (1 හි) සඳහන් පරිදි මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අය කිරීම

මෙම බල ප්‍රදේශයේ පර්චස් 10 ට අඩු ඉඩමක් සඳහා ප්‍රාග්ධන වටිනාකමින් 0.5% ක් ද, පර්චස් 10-20 අතර ප්‍රාග්ධන වටිනාකමින් 1%ක් ද, පර්චස් 20-40 ත් අතර ප්‍රාග්ධන වටිනාකමින් 1.5%ක් ද, ඊට වැඩි ඉඩම් සඳහා ප්‍රාග්ධන වටිනාකමින් 2% ක් ද අය කිරීමට ද (ඈ) වගන්තිය ප්‍රකාරව එම අදාළ ඉඩමේ පවතින ගොඩනැගිල්ලට යට වී ඇති බිම් ප්‍රමාණයට අමතරව තවත් පර්චස් 10 ක් පමණ ඉවත් කර ඉතිරි ඉඩම සඳහා 247 (ඈ) අනුව කටයුතු කරනු ලැබේ.

උපලේඛන අංක V

247 (ඉ) යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම

මොරටුව මහ නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබෙන මුදලින් 1% (සියයට එකකට) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයන් හෝ අනුනියෝජිතයා විසින් ගෙවිය යුතු ය.

වාහන ගාස්තු අය කිරීම :

- මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති වාහන ගාල් සඳහා ගාල් ගාස්තු වශයෙන් එක් රථයකට වාර්ෂිකව රු. 1,500.00ක් ගෙවිය යුතු ය. ඉහත ගාස්තු සඳහා අදාළ බදු මුදල් ද ගෙවිය යුතු ය.

- මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති ත්‍රිරෝද රථ ගාල් සඳහා ගාල් ගාස්තු වශයෙන් එක් ත්‍රිරෝද රථයකට වාර්ෂිකව රු. 500.00ක් ගෙවිය යුතු ය. ඉහත ගාස්තු සඳහා අදාළ බදු මුදල් ද ගෙවිය යුතු ය.

- පාපැදි බලපත්‍ර ගාස්තු රු. 5.00 ක් ද, දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 35.00ක් ද අයකරනු ලැබේ.

- වෙළෙඳ කරත්ත/වෙළෙඳ පා පැදි බලපත්‍ර ගාස්තු රු. 15.00 ක් ද, දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 35.00 ක් ද අයකරනු ලැබේ.

ආකාශ කොඩි (බැනර්) සහ කටවුට්

(වර්ග අඩියකට)	*ගාස්තුව රු. ශත*
මුදල් ඉපයීමේ කාර්යයක් නොවන විට	15.00
මුදල් ඉපයීමේ කාර්යයක් වන විට	25.00
ආධාරකයක එල්ලා තබනු ලබන කටවුට් සඳහා	30.00
ඉඩම් විකිණීමේ/වෙන්දේසි කිරීමේ කාර්යයන් සඳහා	75.00

මෙම ගාස්තු සති දෙකක කාලයක් සඳහා වන අතර අතිරේක සතියකට හෝ ඉන් කොටසකට 25% ක අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ. සති තුනක ප්‍රදර්ශනයකින් පසු නැවත ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය නම් නැවත මුල් ගාස්තුව අය කරනු ලැබේ. ඉහත ගාස්තුවලට අතිරේකව රජයෙන් පනවන බදු අයකරනු ලැබේ.

වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මොරටුව මහ නගර සභා සීමාව තුළ ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු අයකිරීම

උපලේඛන අංක - VI

අනු. අංකය	ප්‍රචාරක දැන්වීම් විස්තරය	දැන්වීම් පුවරු ගාස්තු: මාසයක් හෝ ඉන් කොටසකට	දැන්වීම් පුවරු ගාස්තු: මසකට වැඩි අවුරුද්දක් හෝ ඉන් කොටසක් සඳහා
		රු. ශත	රු. ශත
01	වේදිකා නාට්‍යයක් හෝ නාට්‍යයක්, සිනමා ලේඛිත ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 ට හෝ ඉන් කොටසකට	20 0	200 0
02	සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09ට හෝ ඉන් කොටසකට	30 0	300 0
03	සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 ට හෝ ඉන් කොටසකට	50 0	500 0
04	සිනමා ලේඛිත ප්‍රසංගයක් හෝ වෙනත් යම් ප්‍රසංගයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූ ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කර ඇත්තාවූ ද, ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග මීටර් 0.09 හෝ ඉන් කොටසකට	15 0	150 0
05	සිනමා ලේඛිත ප්‍රසංගයක් සම්න්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග මීටර් 0.09 හෝ ඉන් කොටසකට	25 0	250 0
06	දැන්වීම් පුවරුවක හෝ ආධාරකයක ප්‍රදර්ශනය කෙරෙන්නාවූ ද යම් තැනැත්තකු විසින් ගෙන යනු ලබන්නාවූ, නැතහොත් ධාවනය වන වාහනයක සවිකර ඇත්තාවූ ප්‍රචාරක දැන්වීමක් සඳහා		

	වර්ග අඩි 1 සඳහා	ලිත් වර්ෂයකට හෝ මසකට හෝ ඉන් කොටසකට ප්‍රදර්ශන ගාස්තු රු. ශත
1.	විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරු (වර්ග අඩි 50ට අඩු)	100 0
	A ශ්‍රේණියේ මාර්ග සඳහා	150 0
2.	විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරු (වර්ග අඩි 50 ට වැඩි)	150 0
	A ශ්‍රේණියේ මාර්ග සඳහා	200 0
3.	විදුලි ආලෝකය සහිත දැන්වීම් පුවරු	200 0
	A ශ්‍රේණියේ මාර්ග සඳහා	250 0

	වර්ග අඩි 1 සඳහා	*ලිත් වර්ෂයකට හෝ මසකට හෝ ඉන් කොටසකට ප්‍රදර්ශන ගාස්තු රු. ශත*
4.	පුළුල් තිරයේ LED දැන්වීම් පුරුවක් ප්‍රදර්ශනය වර්ග අඩියකට පුළුල් තිරයේ LED දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය දිනක් සඳහා	2,500 0 500 0
5.	වාර්ෂිකව ගෙවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු අදාළ දිනයේදී නොගෙවන්නේ නම් එම අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමේදී සිදුවන (ස්ථාවර ගාස්තුවක් ලෙස) අයකරනු ලබන ගාස්තුව	5,000.00
	ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.	
07.	නගර සභාවට අයත් භූමියක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන්නේ නම් ප්‍රදර්ශන ගාස්තුවලට අමතරව බිම් කුලිය ලෙස එක් වර්ෂයකට ගෙවිය යුතු මුදල (අවම වර්ගඵලය වර්ග අඩි 200ක් සඳහා) (බිම් කුළිය ගාස්තු හා සභාව අනුමැතිය මත සංශෝධනය කළ හැක.)	25,000.00
	වැඩිවන සෑම වර්ග අඩියක් සඳහා ගෙවිය යුතු බිම් කුලිය	25.00
	ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අයකරනු ලැබේ.	
08.	මෙම සභාවට වෙළෙඳ බලපත්‍ර හෝ වෙළෙඳ බදු ගෙවන්නාවූ ස්ථානයක එම ස්ථානීය නාමය හා ස්වභාවය දක්වෙන වර්ග අඩි 20ක් හෝ ඉන් කොටසක් සහිත විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරුවක් සඳහා උපලේඛන VI වන 06 ඡේදයේ I උපවගන්තියේ දක්වෙන ප්‍රදර්ශන ගාස්තුවලින් නිදහස් වේ.	

අර්ථ නිරූපනය :-

"ප්‍රචාරක දැන්වීම්" යන්නට ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ප්‍රචාරක දැන්වීම් කාර්ය සඳහා යොදා ගනු ලබන හෝ ඒ ස්වභාවයෙන් වූ යම් වචනයක්, අක්ෂරයක්, අංකයක්, සළකුණක්, පුවරුවක්, දැන්වීමක්, උපක්‍රමයක් අනුරුවක් හෝ නිරූපණයක් ඇතුළත් වේ.

"දැන්වීම් පුවරුව" යන්නෙන් යම් නිර්මිතයක්, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, බිත්ති ප්‍රදර්ශන පුවරුවක් හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රදර්ශනය කිරීමේ කාර්ය සඳහා උපයෝගි කර ගන්නා වෙනත් කවර හෝ උපක්‍රමයක් අදහස් වේ, තව ද,

"ගුවන් පුවරුව" යන්නෙන් යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට හෝ වෙනත් නිර්මිතයකට ඉහළින් හෝ ඒ මත කණුවකට, රිටකට, ස්ථම්භයකට, රාමු තට්ටුවකට හෝ වෙනත් ආධාරකයක් සවිකර ඇති හෝ ඒ මත රඳවා ඇත්තා වූද, යම් වීදියක, පාරක, ඇළක හෝ වැවක යම් ලක්ෂ්‍යයක සිට අහස පසු තලය වශයෙන් ඇතිව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් දෘශ්‍යමානව ඇත්තාවූ ද, ප්‍රචාරක කාර්යය සඳහා උපයෝගී කර ගන්නා යම් වචනයක්, අක්ෂරයක්, අනුරුවක්, සලකුණක්, උපක්‍රමයක් හෝ නිරූපණයක් අදහස් වේ.

උපලේඛන අංක VII

2019 වර්ෂයට විනෝද බදු ගාස්තු පැනවීම

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (I) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මොරටුව මහ නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි වූ පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට 25% සමාන බද්දක් පනවා අයකළ යුතු ය. නැටුමක්, තරග ක්‍රීඩාවක්, ක්‍රීඩාවක්, සිනමා දර්ශන, විනෝදවීමක්, සංදර්ශනයක්, ගායනයක් හෝ විවිධ ප්‍රසංගයක් හෝ පනතේ විනෝද කටයුත්තක් ලෙස අර්ථ කථනය කර ඇති ඕනෑම කටයුත්තක් සඳහා යම් තැනැත්තෙකු විසින් අලෙවි කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 25% ක විනෝද බද්දක් පනවා අය කිරීමට තීරණය කර ඇත.

කඩුගන්නාව නගර සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 164 (1) වගන්තිය සමග කියවිය යුතු 162 වන වගන්තිය යටතේ කඩුගන්නාව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කඩුගන්නාව නගර සභාවේ මහ සභා රැස්වීමේ තීරණ අංක (එ) (2) (ii) (1) යටතේ 2020 වර්ෂය සඳහා පහත දැක්වෙන යෝජනාව සභාවේ ස්ථිරකර සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේදී කඩුගන්නාව නගර සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අමිල රංග වේරගොඩ,
සභාපති,
කඩුගන්නාව නගර සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කඩුගන්නාව නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ කඩුගන්නාව නගර සභාව විසින් 2020 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා 1939 අංක 61 දරන නගර සභා (සංශෝධිත) පනතේ වැඩිදුරටත් සංශෝධිත 1985 අංක 20 දරන මහ නගර සභා (සංශෝධිත) පනතේ වැඩිදුරටත් සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 164 හා 165 වැනි වගන්තිවලට යටත්ව කඩුගන්නාව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත උපල්ඛනයේ I තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් 2020 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙනක යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතුයැයි ද ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි ද කඩුගන්නාව නගර සභාවේ මාසික සභාව වෙත යෝජනා කරමි.

උපලේඛනය - අංක 01

I වැනි තීරුව	*II වැනි තීරුව*		
වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බලපත්‍ර ලබා ගත යුතු සථාන :			
01. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. බත් කඩයක්, තේ කඩයක්, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
03.	භෝජනාගාරයක් පැවැත්වීම*	500 0	750 0	1,000 0
04.	හෝටලයක් පවත්වාගෙන යාම*	500 0	750 0	1,000 0
05.	ලැගුම්හලක් (නවාතැන්පලක්) පවත්වාගෙන යාම*	500 0	750 0	1,000 0
06.	සිසිල් බීම කර්මාන්තශාලාවක් පවත්වගෙන යාම	500 0	750 0	1,000 0
07.	අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	කිරි පට්ටි හා කිරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කරණවැමි මැදිරි හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සැලුන් හෝ රූපලාවන්‍යාගාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	හරක් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	හරක්ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පළතුරු අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	එළවළු වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	අවමංගල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පෞද්ගලික ඉගැනුම් ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

* 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද අවස්ථාවක බලපත්‍ර ගාස්තුව පෙර වර්ෂය සඳහා එම හෝටලයේ, ආපනශාලාවේ හෝ හෝ නවාතැන්පොළේ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

පීඩාකාරී ව්‍යාපාර :

1.	පොහොර හෝ රසායන පොහොර නිපදවීම	500 0	750 0	1,000 0
ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහා නගර සභා අඥාපනත මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 1989/01/20 වැනි දිනැති අංක 541/17 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාවේ 2004/02/10 වැනි දින හා 2008/09/09 වැනි දිනයන්හි පැවති මහා සභාව විසින් වැළඳගෙන ඇති අතර, ඒ අනුව එහි සඳහන් II කොටසේ සඳහන් වන ප්‍රචාරක දැන්වීම් පිළිබඳව ඇති අතුරු ව්‍යවස්ථාව අනුව දැන්වීම් පුවරු සඳහා බලපත්‍රයක් ලබාගැනීමේදී පහත උපලේඛනයේ සඳහන් මිළ ප්‍රමාණයන් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2019.09.05 දින පැවති මහා සභාව විසින් තීරණ අංක 2019/මාමනස/සභා යෝජනා/152 ඉ.7 යටතේ ඒකමතිකව සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එම බදු මුදල් 2020 ජූනි 30 වැනි දිනට පෙර ගෙවා මෙම බලපත්‍ර ලබාගත යුතු බවත් මෙයින් දන්වා සිටිමි.

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව - මාතර.

2019 ඔක්තෝබර් මස 31 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. නගරයේ වෙළඳ සැල් හා ව්‍යාපාර ආයතන විසින් තම වෙළෙඳ නාමය පමණක් යොදා සිය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රසිද්ධ කරන දැන්වීම් පුවරුවලින් වර්ග අඩියකට රු. 75/- බැගින් අය කිරීමටත්,

2. ජාත්‍යන්තර හා දිවයින පුරා ව්‍යාප්ත සමාගම්වලින් හෝ ව්‍යාපාර විසින් නගරයේ වෙළෙඳ සැල්වල අදාළ නම/වෙළඳ නාමය යොදා වෙළඳ සැල්වල හෝ ව්‍යාපාර ආයතනවල හෝ ඉන් පිටත ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරුවලින් වර්ග අඩියකට රු. 200/- ක මුදලක් ගෙවිය යුතුය.

3. 2020 වර්ෂය සඳහා මාතර මහා නගර සභා සීමාව තුළ තාවකාලිකව ප්‍රදර්ශනය කරනු ලබන බැනර් සහ කටවුට් සඳහා ලිත් මසක කාල සීමාවක් වෙනුවෙන් වර්ග අඩියකට රු. 40.00 ක් අය කිරීමටත්,

4. ඩිජිටල් දැන්වීම් පුවරු ගාස්තු - මහා නගර සභා භූමියක ප්‍රදර්ශනය කරන ඩිජිටල් දැන්වීම් පුවරුවලින් වර්ග අඩියක් සඳහා රු. 2,000/- බැගින් ප්‍රදර්ශන ගාස්තුවක් අය කිරීම.

ස්ථිර දැන්වීම් පුවරුවලට අදාල මාතර ප්‍රධාන බස් නැවතුම් පොළේ සිට සමනලයා වටරවුම තෙක් තංගල්ල පාර, එළියකන්ද හන්දිය තෙක් වෙරළ පාර සහ නූපේ හන්දිය තෙක් අනගාරික ධර්මපාල මාවත, නුපේ හන්දිය සිට මහා නගර සීමාව තෙක් අකුරැස්ස පාර, මාතර බෝධිය අසල සිට තුඩාව ඇළ මාර්ගය තෙක් හක්මන පාර යන ස්ථානවල (අකුරැස්ස පාර හැර) ප්‍රදර්ශනය කරන ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට වාර්ෂිකව රු. 1,250/- ක් බැගින් ප්‍රදර්ශන ගාස්තුවක් අය කිරීම.

ඉහත සීමාවන් හැර අනෙකුත් ස්ථානවල ප්‍රදර්ශනය කරන ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට වාර්ෂිකව රුපියල් 1,000/- ක ගාස්තුවක් අය කිරීම.

12 - 14/7

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද, සහ

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2020.03.31 දිනට ප්‍රථම දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද 2019.09.17 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
2019 වර්ෂයේ දී ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	300 0
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 159/1

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදළව වරිපනම් පනවා අය කිරීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල (නිශ්චල දේපලවල) 2019 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කළ 2011 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම 2020 වර්ෂයේ මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස ද, බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට 2019.09.17 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-159/2

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදළ වෙළඳ බලපත්‍ර ගාස්තු පනවා අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයට නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට 2019.09.17 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරය *II වැනි තීරය*

පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම

බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
හෝටලයක් හෝ භෝජනාගාරයක්	500 0	750 0	1,000 0
රෙස්ටුරන්ට්	500 0	750 0	1,000 0
කිරිපට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
සිසිල් බීම නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
අයිස් නිපදවීම	500 0	750 0	1,000 0
ගැලුම් 50ට වැඩි පොල්තෙල් ගබඩා	500 0	750 0	1,000 0
ගැලුම් 10ට වැඩි එළවළු තෙල් ගබඩා	500 0	750 0	1,000 0
ග්‍රොස් 10ට වැඩියෙන් ගිනිපෙට්ටි ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
යන්ත්‍රෝපකරණ සහිත ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අතින් ලී ඉරන ඉරුම්හලක් හෝ මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
වඩුවැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
හුණු මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
කලුගල් කැඩීම හා පිපිරවීම	500 0	750 0	1,000 0
කබොක් හා බොරලු සෑදීම සඳහා	500 0	750 0	1,000 0
මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ව. අඩි 750ට අඩු)	500 0	750 0	1,000 0
මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ව. අඩි 750ට වැඩි)	500 0	750 0	1,000 0
බයිසිකල් අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අම්ලකර වායුව පාවිච්චි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බැටරි චාජ් කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
වයින් ස්ප්‍රිතු මෙතිලේටඩ් විකිණීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
අයිස්ක්‍රීම් හෝ ශීතකළ බීම වර්ග විකිණීමේ මධ්‍යස්ථානයක්	500 0	750 0	1,000 0
අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
රසකැවිලි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
ශීතකරණවල තබා ගෙන කුකුල් මස් විකිණීම	500 0	750 0	1,000 0
කොන්ක්‍රීට් නිෂ්පාදන ස්ථානයක්	500 0	750 0	1,000 0
ගෑස් විකිණීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
ඇලුමිනියම්, ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක්	500 0	750 0	1,000 0
මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
ඉන්ධන පිරවුම් හලක් සඳහා	500 0	750 0	1,000 0
ගිනිකෙළි ද්‍රව්‍ය හෝ රතිඤ්ඤු අලෙවි කිරීම	500 0	750 0	1,000 0
ලී භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
අලුත් මාළු විකිණීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
හුණු අලෙවි කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
කෘෂි රසායන අලෙවි කිරීම	500 0	750 0	1,000 0
සීනි බෝල, ග්ලූකෝස් නිපදවීම	500 0	750 0	1,000 0
ඇසිඩ් වර්ග බෝතල්ගත කිරීම හා බෙදා හැරීම	500 0	750 0	1,000 0
යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
සුපිරි වෙළඳ සල්	500 0	750 0	1,000 0
සම්බාහන මධ්‍යස්ථානයක්	500 0	750 0	1,000 0

12 - 159/3

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයේ කර්මාන්ත බදු පැනවීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

(*ආ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2020.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
යන්ත්‍ර මගින් කලුගල් කැඩීම හා විකිණීම	500 0	750 0	1,000 0
කොහු මෙට්ට නිෂ්පාදනය	500 0	750 0	1,000 0
රබර් මිශ්‍ර කොහු මෙට්ට නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
උළු මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
මිරිස් මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
වී මෝල්ක් පවත්වාගෙන යාම (කමත් රහිත)	500 0	750 0	1,000 0
වී මෝල්ක් පවත්වාගෙන යාම (කමත් සහිත)	500 0	750 0	1,000 0
වී මෝල්ක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
වී මෝල්ක් පවත්වාගෙන යාම (කුඩා ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන කර්මාන්ත ශාලාවක්	500 0	750 0	1,000 0
කොන්ක්‍රීට් නිෂ්පාදන කරන ස්ථානයක්	500 0	750 0	1,000 0
ඇලුමිනියම්, ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
සිසිල් බීම නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
කුඩා ප්‍රමාණයේ ඇලුමිනියම් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
මධ්‍යම ප්‍රමාණයේ ඇලුමිනියම් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ලීවලින් භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම	500 0	750 0	1,000 0
සීනිබෝල, ග්ලූකෝස් ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0

12 - 159/4

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයේ රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද, සහ

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාරව, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් ම යථොක්ත 2020.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :	
(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්,	18 00
(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 00
සෑම කරත්තයක් සඳහා	20 00
සෑම අත් කරත්තයක් සඳහා	10 00
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 00
සෑම ඇතෙකු සඳහා	50 00

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයෙහි වෙළෙඳ කාර්යන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 159/5

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට සතිපොළ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර අංක 01 උපලේඛනයේ පරිදි දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සතිපොළෙහි මෙම බදු අය කිරීම ප්‍රාදේශීය සභාවට සෘජුව වෙළෙඳ අයිතිය බදු දීමේ බදුකරු විසින් 2020 වර්ෂය වෙනුවෙන් බදු අය කිරීමට 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 08-3.1 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සතිපොළෙහි වෙළෙඳුන්ගෙන් අය කළ හැකි උපරිම ගාස්තු

		රු.ශත
01.	විවෘත කඩ (භූමියේ වර්ග අඩි 01කට)	05 0
02.	වෙළෙඳ පා පැදියක් සඳහා	100 0
03.	වෙළෙඳ යතුරු පැදියක් සඳහා	250 0
04.	වෙළෙඳ අත් ට්‍රැක්ටරයක් සඳහා	500 0
05.	වෙළෙඳ ලොරියක් සඳහා	750 0
06.	වෙළෙඳ වෑන් රථයක් සඳහා	750 0
07.	මාළු ලෑල්ලක් සඳහා (ලොරි සහ වෑන්)	750 0

12 - 159/6

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු (සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 කොටස)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) හා 122, 126 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළාත් පාලන ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථානුකූලව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් හෝ දැන්වීම් ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් (බැනර් ඇතුළුව) පහත උපලේඛනයේ දක්වෙන ගාස්තු 2020.01.01 දින සිට 2020.12.31 වැනි දින දක්වා බදු පනවා අයකිරීමට 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 08-6 හා 08-14 දරන සභා සම්මුති යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - 1

		වර්ග අඩියකට ගාස්තුව රු. ශත
01. ආකාස කොඩියක් (බැනරයක්) සතියකට		
(I)	මුදල් ඉපැයීමේ කටයුත්තක් නොවන විට	20 0
(II)	මුදල් ඉපැයීමේ කටයුත්තක් වන විට	50 0
(III)	ඉඩම්/වෙන්දේසි/විකිණීම් වෙනුවෙන් වූ විට (අතිරේක සතියක් සඳහා ඉහත ගාස්තුවලින් 25% කි)	50 0
02. ස්ථාවර දැන්වීම් පුවරු (වර්ෂයකට)		
(1)	වර්ග අඩි 30 ක් දක්වා (ව. අ. 01 ක් සඳහා)	40 0
(2)	වර්ග අඩි 31 සිට 40 දක්වා (ව. අ. 01 ක් සඳහා)	60 0
(3)	වර්ග අඩි 40ට වැඩි වන විට (ව. අ. 01 ක් සඳහා)	70 0
(4)	බිත්තියේ ඇඳ ඇති (ව. අ. 01 ක් සඳහා)	30 0
(5)	විශේෂිත දැන්වීම් පුවරු ඉහත පරිදි (ව. අ. 40 සිට වැඩි ව. අ. 1 ක් සඳහා)	75 0
03. ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා දිනකට (මසකට රු. 6,000 උපරිමයකට යටත්ව)		200 0
04. කුළුණු මත සවිකරන ලද දැන්වීමක වර්ග අඩියක්		200 0
05. කුළුණෙහි දික් අඩියක් සඳහා		200 0

12 - 159/7

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 2020 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් සභා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළාත් පාලන ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව (260 වන අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2020.01.01 වැනි දින සිට 2020.12.31 දින දක්වා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු මෙම සභාවට අය කිරීමට 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - I

ගොඩනැගිලි ඉදි කිරීම

ගෙබිම විශාලත්වය (ව. අඩි)	*පදිංචිය සඳහා*	*වාණිජ හෝ වෙනත් භාවිතය*
	රු. ශත	*රු. ශත*
750 හෝ ඊට අඩු	500 0	750 0
751 සිට 1,000	750 0	1,000 0
1,001 සිට 1,100	1,000 0	1,250 0
1,101 සිට 1,500	1,250 0	1,750 0
1,501 සිට 2,000	1,500 0	2,250 0
2,001 සිට 2,500	2,000 0	2,750 0
2,501 සිට 3,000	2,500 0	3,500 0
3,001 සිට 3,500	3,000 0	4,250 0
3,501 සිට 4,000	4,000 0	5,000 0
4,001 සිට 5,000	5,000 0	6,500 0
5,001 සිට 6,000	6,000 0	8,000 0
6,001 සිට 8,000	8,000 0	10,000 0
8,001 සිට 10,000	10,000 0	20,000 0
10,001 ට වැඩි සෑම ව.අ. 01 ක් සඳහා	40 0	100 0

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා එක් එක් සේවාවන් මත ගාස්තු අයකිරීම

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ 2020 වර්ෂය සඳහා එක් එක් සේවාවන් මත ගාස්තු අය කිරීම පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු මෙම සභාවට අයකිරීමට 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 08-14 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන සේවාවන් වෙනුවෙන් එක් එක් කාර්යයන් සඳහා බදු පනවා ගාස්තු අය කරන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය 1

		රු.
01.	පුස්තකාල පෝරම ගාස්තු	10 0
02.	සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු	25 0
03.	පාසල් ළමුන්ගේ සාමාජික ගාස්තු	25 0
04.	වැඩිහිටියන්ගේ සාමාජික ගාස්තු	50 0
05.	දඩ - දිනකට එක් පොතකට	02 0
06.	ගොඩනැගිලි ඉල්ලුම්පත් ගාස්තු	400 0
07.	පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තු	300 0
08.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	100 0
09.	දූන්වීම් පුවරු ඉල්ලුම්පත්‍ර ගාස්තු	100 0
10.	පාපැදි බලපත්‍ර සේවා ගාස්තු	26 0
11.	බිම් කුළිය වර්ග අඩි 01ට - බල ප්‍රදේශය තුළ පුද්ගලයන්ට	04 0
12.	බිම් කුළිය වර්ග අඩි 01ට - බල ප්‍රදේශයෙන් පිට පුද්ගලයන්ට	05 0
13.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුලියට දීම - දිනකට	3,000 0
14.	ගල්රෝල කුළියට දීම (ටොන් 01)	3,500 0
15.	ගල්රෝල කුළියට දීම (ටොන් 03)	7,500 0
16.	ජල බවුසරය පැය 12ක් තබා ගැනීමට	500 0
17.	ජල බවුසරයෙන් ජලය හලාගෙන ඒමට (ප්‍රවාහනය රහිතව)	500 0
18.	බැකෝ ලෝඩරය කුලියට දීම - මීටර් පැයකට	3,000 0
19.	මෝටර් ග්‍රේඩරය කුලියට දීම - මීටර් පැයකට	4,000 0
20.	අයාලේ යන ගවයින් ඇල්ලීමේ ගාස්තු (ලොකු ගවයෙකුට)	1,000 0
21.	අයාලේ යන ගවයින් ඇල්ලීමේ ගාස්තු (කුඩා ගවයෙකුට)	500 0
22.	අයාලේ යන ගවයින් ඇල්ලීමේ කණු ගාස්තු	100 0
23.	කියුබ් 01 ටිපර් රථය කුළියට දීම - (දිනකට - පැය 08ක කාල සීමාව සඳහා)	7,500 0
24.	කියුබ් 2.8 ටිපර් රථය කුළියට දීම - (දිනකට - පැය 08ක කාල සීමාව සඳහා)	10,000 0
25.	ට්‍රැක්ටර් රථය කුලියට දීම - (දිනකට)	5,000 0
26.	බස් මගී ආවරණ කඩ කාමර කුලී ගාස්තු	200 0

		රු.
27.	වීථි රේඛා ඉල්ලුම්පත් ගාස්තු	100 0
28.	වීථි රේඛා/නොපවරා ගැනීමේ සහතිකය	1,000 0
29.	ගොඩනැගිලි අනුකූලතා සහතිකය	1,000 0
30.	වරිපනම් බදු නම වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තු	1,000 0
31.	මළ සිරුරක් ආදාහනය කිරීම සඳහා ගාස්තු - බලප්‍රදේශය තුළ	10,000 0
32.	මළ සිරුරක් ආදාහනය කිරීම සඳහා ගාස්තු - බලප්‍රදේශයෙන් පිට	12,000 0
33.	බල ප්‍රදේශය තුළ උප නගරවල කසල බදු අය කිරීම (ගෘහස්ථ)	100 0
34.	බල ප්‍රදේශය තුළ උප නගරවල කසල බදු අය කිරීම (ව්‍යාපාර ස්ථාන)	150 0
35.	ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු	100 0
36.	ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීමේ ගාස්තු	500 0
37.	කාබනික පොහොර කිලෝග්‍රෑම් 25 පැකට් එකක් අලෙවි කිරීම	300 0
38.	නාගරික උද්‍යානයට එක් අයකුට ඇතුල් වීමේ ගාස්තු	20 0
39.	නාගරික උද්‍යානයේ පිහිණුම් තටාකය භාවිතය කිරීම (ළමා) පැයකට	50 0
40.	නාගරික උද්‍යානයේ පිහිණුම් තටාකය භාවිතය කිරීම (වැඩිහිටි) පැයකට	100 0
41.	නාගරික උද්‍යානයේ පොකුණේ බෝට්ටු පැදීම සඳහා (ළමා) පැයකට	50 0
42.	බල ප්‍රදේශයේ පිහිටි රථගාල් සඳහා පාපැදියක් ඇතුල් කිරීමේ ගාස්තු	10 0
43.	බල ප්‍රදේශයේ පිහිටි රථගාල් සඳහා යතුරුපැදියක් ඇතුල් කිරීමේ ගාස්තු	20 0
44.	බල ප්‍රදේශයේ පිහිටි රථගාල් සඳහා ත්‍රිරෝද රථයක් ඇතුල් කිරීමේ ගාස්තු	30 0
45.	බල ප්‍රදේශයේ පිහිටි රථගාල් සඳහා අනෙකුත් වාහන ඇතුල් කිරීමේ ගාස්තු	50 0
46.	නාගරික උද්‍යානයට ජංගම වෙළෙඳ රථ ඇතුල් කිරීම සඳහා ගාස්තු	100 0
47.	නාගරික උද්‍යානයේ මංගල දර්ශන ඡායාරූප ගැනීම සඳහා	1,000 0
48.	යාන්ත්‍රික විසි කැත්ත ලබා දීම (ට්‍රැක්ටරය සමග) මීටර් පැයකට	2,000 0
49.	යාන්ත්‍රික විසි කැත්ත (ට්‍රැක්ටරය සමග) දිනකට	10,000 0

12 - 159/9

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සුනඛ බද්ද

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරිය)

2020 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරිය) 4 වැනි වගන්තිය ප්‍රකාරව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් සඳහා රු. 60.00 බැගින් 2019 වර්ෂය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇති බවත්, 2020 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට 2019.09.17 වැනි දින පැවැති සභා රැස්වීමේදී තීරණය කරන ලදී.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 18 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-159/10

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා පාරිසරික පනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදාළ පරිසර පනත යටතේ බලපත්‍ර ගාස්තු බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05.12.i යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2000 අංක 53 හා 1988 අංක 56 දරන යෝජනාව 1980 අංක 40 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මධ්‍යම පරිසර අධිකාරිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව කටුවන ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත ආරම්භ කර පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර, කර්මාන්ත සම්බන්ධයෙන් ඉහත කී පනතේ අදළ සංශෝධන යටතේ පවරා ඇති රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර, කර්මාන්ත පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2020 වර්ෂයට බලපත්‍රයක් ලබා ගත යුතු යැයි කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

ව්‍යාපාර/ කර්මාන්ත	රු. ශත
01. අයදුම්පත් ගාස්තුව	100.00
02. අයදුම්පත් අලුත් කිරීමේ ගාස්තුව	50.00

මූලික ආයෝජනය	පරීක්ෂණ ගාස්තු රු. ශත
රු. 250,000 හෝ ඊට අඩු	3,000.00
රු. 250,000 - රු. 500,000	3,750.00
රු. 500,001 - රු. 10,00,000	5,000.00
රු. 10,00,000 ට වැඩි	10,000.00
වර්ෂ තුනකින් නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව	4,000.00

පහත සඳහන් කර්මාන්ත සඳහා බලපත්‍ර ලබා ගත යුතු වේ :-

1 සියලුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු)
2 සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
3 සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදෙන පොල්තෙල් සිදීමේ කර්මාන්ත
4 සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදෙන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
5 වියලි ක්‍රියාවලි සහිත වී මෝල්
6 මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1000ට අඩු වන ඇඹරුම්හල්
7 දුම්කොළ වේලීමේ කර්මාන්ත
8 සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 500ක් හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත

9 කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10 ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11 කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12 යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13 ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
14 සියලු බෙලිකටු ඇඹීරීමේ කර්මාන්ත
15 එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර 600ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කැනීම්
16 දිනකට ඝන මීටර 50ට අඩු දුව ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
17 බහු කාර්ය යන්ත්‍ර භාවිතයෙන් කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5ට වැඩි 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
18 නේවාසික කාමර 5ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
19 වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදුකරන ගරාජ හැර අනෙකුත් වාහන අළුත්වැඩියා කිරීමේ/ නඩත්තු කටයුතු සිදුකරන ගරාජ්
20 ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන
21 වාහන සේවා කටයුතු සිදුනොකරන කන්ටේනර් බහාලු පර්යන්ත
22 සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
23 ඊයම් උණුකිරීම සිදුකිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

12-173/1

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදාළ ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05.12.ii යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් පාලන *අති විශේෂ* ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/ දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට දොළකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	රු. ශත
01. බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම (වර්ෂයකට) මසකට වැඩි ප්‍රචාරක දැන්වීම් පුවරු	100.00
02. බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට මසකට අඩු තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරු	50.00

12-173/2

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදාළ වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05.12.iii යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගොස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කටුවන ප්‍රාදේශීය සභාව ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය		*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
අනු. අංකය		*රු. 500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	බත්කඩ, ආපන ශාලා සහ තේ කෝපි කඩ	500 0	750 0	1,000 0
02	හෝටල්	500 0	750 0	1,000 0
03	බේකරි	500 0	750 0	1,000 0
04	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම, ආහාර විකිණීම	500 0	750 0	1,000 0
05	වාහන නතර කර තැබීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
		බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*	
අනු. අංකය		*රු. 500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
06	ලැගුම් නිවාස	500 0	750 0	1,000 0
07	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
08	මාළු විකිණීම	500 0	750 0	1,000 0
09	මස් විකිණීම	500 0	750 0	1,000 0
10	ලොන්ඩරි	500 0	750 0	1,000 0
11	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
12	ජලසම්පාදනය	500 0	750 0	1,000 0
13	ළිං තැනීම	500 0	750 0	1,000 0
14	කොණ්ඩා සැකසීමේ සැලුන් හල් සහ බාබර් සාප්පු/ බියුටි සෙන්ටර්	500 0	750 0	1,000 0
අන්තරාදායක ව්‍යාපාර :				
01	කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
02	පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවීම ගබඩාකර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	බෝට්ටු එන්ජින් අළුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	වී පාහින මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05	විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	කොන්ක්‍රීට් වැඩ හා කැටගල් වැඩ පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	දුම් පරීක්ෂණ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09	වාහන පූර්ණ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10	මධ්‍යම ප්‍රමාණයේ ගරාජයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11	සිංහල බෙහෙත් බඩු සාප්පුවක් පවත්වාගෙන යාම හා ආයුර්වේද බෙහෙත් ශාලා	500 0	750 0	1,000 0
12	පැඟිරිතෙල් බොයිලරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13	මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම	500 0	750 0	1,000 0
අප්‍රසන්න ව්‍යාපාර :				
01	කුල් ස්පොට් එකක් හෝ කිරි හලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	කුකුල් මස්, බිත්තර සිල්ලරට හෝ තොග විකිණීම			
03	රස කැවිලි නිපදවීමේ, කේක් වර්ග නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය		*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
අනු. අංකය		*රු. 500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
05	ඔසු පැන් හලක්, කොළ කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටෙස්ට් කඩල) විකිණීම	500 0	750 0	1,000 0
06	කුකුළ් කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	උෆරු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09	පළතුරු වෙළඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10	ශීතකරණයේ තබා මස් විකිණීම	500 0	750 0	1,000 0
11	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12	අයිස්ක්‍රීම්, යෝගට් බීම පැකට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13	එළවළු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14	බිම් මල් අලවිය හා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර :				
01	මිරිස්, ධාන්‍ය වර්ග, පිටි ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	පොල් ලෙලි හා දුඹ පල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	හම් වර්ගවලින් හෝ රබර් වර්ග වලින් භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05	ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤ, නිපදවීමේ හෝ විකිණීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	වාහන ගෑස් කිරීමේ හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	රන්රිදී ලෝහ ආලේපන කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	ස්වර්ණාභරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10	ටයර් ටියුබ් අළුත්වැඩියා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
11	කොප්පරා නිෂ්පාදනය, විකිණීමේ හා ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12	අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13	පොල් තෙල් මෝලක් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14	යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15	වාහන ගාල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16	යාන්ත්‍රික ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17	පා පැදි, යතුරු පැදි, ත්‍රීවීල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදාළ කර්මාන්ත බදු පැනවීමට 2019 අගොස්තු මස 22 වැනි දින පැවති සභාවේ තීරණ අංක 05-12-iv යටතේ ලද යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගොස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (i) වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කටුවන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය. "

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
අනු. අංකය		*රු. 500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	සම්භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	ගඩොල් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	උළු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05	තේ කොළ ඇඹරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	පිත්තල භාණ්ඩ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09	දත් බැඳීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
10	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11	අවහිර කිරීම් සහ අයුතු ඇඳාගැනීම්	500 0	750 0	1,000 0
12	වීදිවල දේශන පැවැත්වීම	500 0	750 0	1,000 0
13	සිල්ලර කඩ	500 0	750 0	1,000 0
14	විදුලි උපකරණ හා ජංගම දුරකථන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
15	ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, කැමරා, වීඩියෝ, ඔරලෝසු අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
16	අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
අනු. අංකය		*රු. 500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17	ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18	විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19	උත්සව භාණ්ඩ කුලියට දීම	500 0	750 0	1,000 0
20	ලොතරැයි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21	මල් පැළ හා විසිතුරු මසුන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22	පාවහන් අලෙවිය හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
23	ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24	යතුරු පැදි, ත්‍රීවීල් අමතර කොටස් අලෙවිය	500 0	750 0	1,000 0
25	ලිපිද්‍රව්‍ය අලෙවිය	500 0	750 0	1,000 0
26	සාප්පු බඩු අලෙවිය	500 0	750 0	1,000 0
27	පූජා භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28	වඩු උපකරණ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29	බටහිර ඖෂධ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30	යකඩ බඩු හා තීන්ත වර්ග අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31	වාහන පේන්ට් හා ටින්කරින් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32	සුදු යකඩ වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33	කෘෂි උපකරණ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34	ඇට වර්ග මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35	කුෂන් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36	සමුපකාර, කෝප් සිටි වෙළෙඳ සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37	සුළු පරිමාණ යන්ත්‍ර සූත්‍ර නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
38	ප්ලාස්ටික් හා ඇලුමිනියම් භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40	දේශීය ද්‍රව්‍ය මිලදී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41	කෑලි රෙදි අලෙවිය	500 0	750 0	1,000 0
42	තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43	වීඩියෝ තැටි අලෙවිය	500 0	750 0	1,000 0
44	කාබන් කියත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45	ඛනිජ තෙල් ප්‍රවාහනය	500 0	750 0	1,000 0
46	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47	වෙල්ඩින් වැඩපලක් හෝ ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48	බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය, පුළන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49	ස්ක්‍රීන් ප්‍රින්ටින් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50	ගල්වලක්, අතින් ගල් කඩන හෝ ගල් මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51	බැටරි චාජ් කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52	කොහු මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53	රෙදි පින්තාරු කිරීම (බතික් වැඩපලක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54	සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55	ලෝහ භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රු. 500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
56	පිත්තල භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57	පානීය ජලය බෝතල්ගත කර ගබඩා කර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58	ඉන්ධන සඳහා දැව කැපුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59	බුලත් පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60	ඉදිකිරීම් උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61	විදුලි සැපයුම් ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-173/4

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදළ බදු පැනවීමට 2019 අගොස්තු මස 22 වැනි දින පැවැති මහා සභාවේ තීරණ අංක 05.12.v යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගොස්තුව මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කටුවන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්ද අදළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන විට	නැත
02. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවූ විට	90.00
03. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවූ විට	180.00
04. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවූ විට	360.00
05. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවූ විට	1,200.00
06. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000.00

12-173/5

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදළ ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-12-vi යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගොස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(176 වැනි අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 03 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්වනු ලබන පහත උපලේඛනයේ සඳහන් සංදර්ශන සඳහා පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2020 වර්ෂයට බලපත්‍රයක් ලබාගත යුතු යැයි කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	රු. ශත
තාවකාලිකව චිත්‍රපට දර්ශන, සර්කස් දර්ශන, මැජික් සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සඳහා	
එක් දිනකට බලපත්‍ර ගාස්තුව	200.00
වැඩිවන සෑම දිනකටම	100.00
සංගීත සංදර්ශනයක් සඳහා එක් දිනකට	500.00
ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට දහයක (10%) විනෝද බද්ද	

12-173/6

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සති පොළ බදු ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදාළ සති පොළ බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-12-vii යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සති පොළවල් මගින් දකුණු පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ආකාරයට 2020 වර්ෂයේ ජනවාරි මස සිට 2020 දෙසැම්බර් දක්වා බදු අයකර ගැනීම සුදුසු බව යෝජනා කරන්නීය.

	රු. ශත
මිද්දෙනිය සතිපොළ :	
01. තොග බදු අයකිරීම විකුණුම් මිලෙන් 5%ක් පමණි	
02. කෙසෙල් නැට්ටකින්	05 0
03. ස්ථිර වෙළඳකුටියක් සඳහා	100 0
04. එළිමහන් කඩබිමක් සඳහා	80 0
05. මාළු ලෑලි එකක් සඳහා	400 0
06. මාළු කුඩයක් සඳහා	100 0
07. ජංගම වෙළෙඳුන් සඳහා	50 0
08. බේකරි කෑම වාහන එකකින්	200 0
09. වාහනයක් තබාගෙන වෙළඳාම් කිරීම	200 0
කටුවන සති පොළ බදු අයකිරීම :	
01. තොග පොළ බදු අයකිරීම විකුණුම් මිලෙන් 5% ක් පමණි	
02. කෙසෙල් නැට්ටකින් රු. 05 කි	
03. ස්ථිර වෙළඳකුටියක් සඳහා	100 0
04. එළිමහන් බිමක් සඳහා	80 0
05. මාළු ලෑලි එකක් සඳහා	250 0
06. මාළු කුඩ එකක් සඳහා	100 0
07. ජංගම වෙළෙඳුන් සඳහා	50 0
08. බේකරි කෑම වාහන එකකින්	100 0
09. වාහනයක් තබාගෙන වෙළඳාම් කිරීම	100 0
කරමැටිය සති පොළ බදු අයකිරීම :	
01. ස්ථිර වෙළඳකුටියක් සඳහා	80 0
02. එළිමහන් කඩබිමක් සඳහා	60 0
03. මාළු ලෑලි එකක් සඳහා	200 0
04. මාළු කුඩයක් සඳහා	100 0
05. ජංගම වෙළෙඳුන් සඳහා	50 0
06. බේකරි කෑම වාහන එකකින්	100 0
07. වාහනයක් තබාගෙන වෙළඳාම් කිරීම	100 0

	රු. ශත
කිරම සති පොළ බදු අයකිරීම	
01. ස්ථිර වෙළඳකුටියක් සඳහා	70 0
02. එළිමහන් කඩබිමක් සඳහා	50 0
03. මාළු ලෑලි එකක් සඳහා	250 0
04. මාළු කූඩයක් සඳහා	100 0
05. ජංගම වෙළෙඳුන් සඳහා	50 0
06. බේකරි කෑම වාහන එකකින්	100 0
07. වාහනයක් තබාගෙන වෙළඳාම් කිරීම	100 0
වරාපිටිය සති පොළ බදු අයකිරීම	
01. ස්ථිර වෙළඳකුටියක් සඳහා	100 0
02. එළිමහන් කඩබිමක් සඳහා	80 0
03. මාළු ලෑලි එකක් සඳහා	250 0
04. මාළු කූඩයක් සඳහා	100 0
05. ජංගම වෙළෙඳුන් සඳහා	50 0
06. බේකරි කෑම වාහන එකකින්	100 0
07. වාහනයක් තබාගෙන වෙළඳාම් කිරීම	100 0

12-173/7

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදළ අක්කර බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-12-viii යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(1) ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර එකකට නොඅඩු එහෙත් පහකට අඩු සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රු. 50/- බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් හා හෙක්ටයාර පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2020 වර්ෂය සඳහා රු. 10 බැගින් වන අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(2) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-173/8

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදළ බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-12-ix යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (i) වැනි වගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරන්නී ය.

12-173/9

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදළ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05.12.x යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්ය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්ය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යැයි සැලකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළ හැකි වන අවස්ථාවක, සහ

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ, හෝ

(ආ) සැබැවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය, ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ, හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැත්තා වූ,

අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% ක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඒ ඉඩමේ අයිතිකරුගෙන් අයකර ගතයුතු බවට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-173/10

කටුවන ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සේවා සැපයීම සම්බන්ධ ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයට අදළ සේවා සැපයීම සඳහා ගාස්තු පැනවීමට 2019 අගෝස්තු මස 22 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-12-xi යටතේ ලද යෝජනාව සහා සම්මත කල බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, කටුවන ප්‍රාදේශීය සභාව මගින් සිදු කරනු ලබන විවිධ සේවා සැපයීම සම්බන්ධව 2020 වර්ෂයට පහත උපලේඛනයේ සඳහන් සේවා ගාස්තු අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

විස්තරය	රු. ශත
වීථිරේඛා නොපවරා ගැනීමේ සහතිකය	500.00
ගොඩනැගිලි ඉදිකිරීම් අනුමත කරගැනීමේ අයදුම්පත්‍ර	1000.00
නළ ළිං අලුත් වැඩියාව	400.00
ගිවිසුම් පත්‍ර	300.00
පිඹුරුපත් අනුමත කිරීම	500.00

ගොඩනැගිලි අයදුම්පත්‍ර වර්ග මීටරයක් සඳහා අය කිරීම :

U/D/A පෙරසැරි ගාස්තු	නේවාසික රු. ශත	ව්‍යාපාරික රු. ශත
ව.මී. 45ට අඩු	500.00	1,000.00
ව.මී. 46- 90 දක්වා	1,500.00	2,000.00
ව.මී. 91- 180 දක්වා	2,500.00	3,000.00
ව.මී. 181- 270 දක්වා	3,500.00	4,000.00
ව.මී. 271- 450 දක්වා	4,500.00	6,000.00
ව.මී. 451- 675 දක්වා	5,500.00	8,000.00
ව.මී. 676- 900 දක්වා	6,500.00	10,000.00
ව.මී. 901- 1225 දක්වා	7,500.00	12,000.00
	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,000 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,000 බැගින්

ඉඩම් අනුබෙදුම් සඳහා පෙරසැරි ගාස්තු :	එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල මාර්ග, කාණු හා පොදු බිම් කොටස් හැර රු. ශත
ව.මී. 150 - 300 අතර	500.00
ව.මී. 301 - 600 අතර	400.00
ව.මී. 601 - 900 අතර	300.00
ව.මී. 900 ට වැඩි	500.00

නගර සීමාවට අයත් නොවන ඉඩම සඳහා ද සභා අනුමැතිය මත ඉහත සඳහන් ගාස්තු අය කරනු ලැබේ.

මායිම් තාප්ප, ආරක්ෂක වැට ඉදිකිරීම	නේවාසික දික් මීටර් 01 ක් සඳහා ගාස්තුව රු. ශත	ව්‍යාපාරික හා වෙනත් දික් මීටර් 01ක් සඳහා ගාස්තුව රු. ශත
ගොඩනැගිලි සීමාවෙන් පිටත	300.00	400.00
ගොඩනැගිලි සීමාව තුළ	500.00	600.00

ඉඩම් කුඹුරු ගොඩ කිරීම	ව.මී. 150 ට අඩු රු. 1,500 ක් සහ එයට වැඩි සෑම මීටර් එකකට රු. 1,000 බැගින්
දුරකථන කුළුණු/ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	උස මීටර් 5 - 20 දක්වා රු. 20,000 ක් සහ වැඩි වන සෑම මීටර් එකකට රු. 100 බැගින්
විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	රුපියල් මිලියන 5 කට රු. 5,000 ක් සහ වැඩි වන සෑම රු. මිලියන එකකට රු. 100 බැගින්

නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම	පෙරසැරි ගාස්තුව ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	නේවාසික රු. ශත
	ව.මී. 45ට අඩු	500.00
	ව.මී. 46- 90 දක්වා	1,000.00
	ව.මී. 91- 180 දක්වා	1,250.00
	ව.මී. 181- 270 දක්වා	1,500.00
	ව.මී. 271- 450 දක්වා	1,750.00
	ව.මී. 451- 675 දක්වා	2,000.00
	ව.මී. 676- 900 දක්වා	2,250.00
	ව.මී. 901 ට වැඩිවන එක් එක් ව.මී. 90ක් සඳහා ම රු. 500 බැගින්	

අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්, සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබාගත යුතුය.)	අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු
නේවාසික	ව.මී. 300 ට අඩු රු. 300 සහ ඊට වැඩිවන සෑම ව.මී. 01කට රු. 10 බැගින්
ව්‍යාපාරික හා වෙනත්	ව.මී. 300 ට අඩු රු. 300 සහ ඊට වැඩිවන සෑම ව.මී. 01කට රු. 20 බැගින්
මායිම් තාප්ප/ ආරක්ෂක බැම් ඉදිකිරීම	පළමු දික් මීටර් 100 සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 01කටම රු. 10 බැගින්
දුරකථන/ විදුලි සංදේශ කුළුණු	උස මීටර් 5 - 20 දක්වා රු. 2,000 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 01 කටම රු. 100 බැගින්
විශේෂ ව්‍යාපෘති	කුඩා පරිමාණ රු. 5,000.00 මධ්‍ය පරිමාණ රු. 10,000.00 මහා පරිමාණ රු. 20,000.00

ආවරණ අනුමැතිය ලබා දීම	ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු
01. නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදීම් කිරීම	එක් එක් බිම් කොටස සඳහා රු. 750.00
02. නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදීම් කිරීම	එක් එක් බිම් කොටස සඳහා රු. 750.00
03. නිසි බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම	

ඉදිකිරීමේ අදියර සඳහා ගාස්තු	*නේවාසික ව.මී. 01 ක් සඳහා ගාස්තු රු. ශත*	*ව්‍යාපාරික හා වෙනත් ව.මී 01 ක් සඳහා ගාස්තු රු. ශත*
අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට(කයිරු මට්ටම)	200 0	500 0
වහල මට්ටම දක්වා ඉදි කොට ඇති විට (වහලය රහිතව)	300 0	1,000 0
වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	400 0	1,500 0
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	500 0	2,000 0
	400 0	400 0

මායිම් තාප්ප/ ආරක්ෂක බැම්ම ඉදිකිරීම
සෑම ව.මී. 150 ට අඩු
රු. 5,000 බැගින් උස සෑම
මීටර් පහකට රු. 10000 බැගින්
එක් දිනකට රු. 50 බැගින්

ව්‍යාපාරික සීමාවෙන් පිටත ඉදිවන ගොඩනැගිලි සඳහා අනුමත ගාස්තුව රු. 10,000

වාහන නැවතුම් බද්ද :	රු. ශත
මිද්දෙනිය රථ වාහන වෑන් රථයක් සඳහා පැය 03 ක් සඳහා	50 0
මිද්දෙනිය රථ වාහන ලොරි රථයක් සඳහා පැය 03 ක් සඳහා	100 0
කටුවන රථ වාහන වෑන් රථයක් සඳහා පැය 03 ක් සඳහා	50 0
කටුවන රථ වාහන ලොරි රථයක් සඳහා පැය 03 ක් සඳහා	100 0
මිද්දෙනිය, කටුවන මාළු ලෑල්ලක් සඳහා බද්ද :	
මිද්දෙනිය මාළු ලෑල්ලක් සඳහා එක් දිනකට	150 0
කටුවන මාළු ලෑල්ලක් සඳහා එක් දිනකට	150 0
සභාව සතු භූමිය බදු දීම :	
මිද්දෙනිය පැරණි වෙළෙඳ පොළ බදු දීම දිනකට	1,000 0
අනු. අංකය	*කර්මාන්තය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
28.	ගෘහ භාණ්ඩ විකිණීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	රෙදි හා රෙදිපිළි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	දැව විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	කොහු, ඉදල්, පාපිසි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ලාක්ෂා කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	මෝටර් රථ වාහනවල විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
40.	පොත්පත් හා ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	රූපලාවන්‍ය ස්ථානයක් හෝ මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
42.	භාණ්ඩ හෝ ද්‍රව්‍ය ගබඩා කර තැබීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
43.	කුකුළන් 50 ට වැඩි කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
44.	ඌරන් 05 ට වැඩි ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
45.	යෝගට් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
46.	ආහාර පිණිස කිරි මිදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	අයිස්ක්‍රීම් හෝ බීම පැකට් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වගෙන යාම	500 0	750 0	1,000 0
48.	එළ කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාංශ භෝග තොග හොන්ඩර් 02ට වඩා වැඩි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
51.	යන්ත්‍රානුසාරයෙන් මිරිස්, කුළුබඩු, ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් හෝ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	අබලි යකඩ හා අබලි ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම හා එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
53.	පාවහන් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
54.	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
55.	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
56.	සිල්ලර බඩු හා තොග බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
57.	තොග වශයෙන් ධාන්‍ය හා එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
58.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
59.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
60.	බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
61.	රබර් ෂීට් නිෂ්පාදනය හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0

12-270/09

වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය අනුව වැල්ලවාය ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද මහා සභාවේ දී අංක 2 (XI) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව තීරණය කොට නිවේදනය කරනු ලැබේ.

ආර්. ඩී. හරමානිස්,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද රු. ශත*
01	(i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා -	25 0
	(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
		ගෙවිය යුතු බද්ද රු. ශත
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම ඇතකු සඳහා	50 0

02 විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-270/10

වැල්ලවාය ප්‍රාදේශීය සභාව

රථ ගාල් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 ඌ උප වගන්තියට අනුව අතුරු ව්‍යවස්ථාවට අනුකූලව වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් ස්ථාපිත කර ඇති වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති ත්‍රීවීල්, ට්‍රැක්ටර් රථ, වෑන් රථ, ලොරි රථ සහ අත්ට්‍රැක්ටර් රථ සඳහා සකස් කරන ඇති වාහන ගාල් කිරීම, නවතා තැබීම, පාලනය කිරීම සඳහා 2019.01.01 වැනි දින සිට පහත උපලේඛනයට අනුව ගාස්තු අය කිරීමට වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් අංක 2 (XII) දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. ඩී. හරමානිස්,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

වාහන වර්ගය	*මසකට අයකරන ගාස්තුව රු. ශත*
ත්‍රීවීල් රථ	100 0
වෑන් රථ	250 0
ලොරි රථ	300 0
ට්‍රැක්ටර් රථ	300 0
අත් ට්‍රැක්ටර් රථ	150 0

දෛනික ජංගම වෙළෙඳාම සඳහා ගාස්තු අය කිරීම

වෙළෙඳාම	*යතුරු පැදි රු. ශත*	*ත්‍රීවීල් රු. ශත*	*අනෙකුත් වාහන රු. ශත*
ජංගම මාළු වෙළෙඳාම	100 0	150 0	200 0
ජංගම පළතුරු වෙළෙඳාම	100 0	150 0	200 0
ජංගම රස කැවිලි හා බේකරි නිෂ්පාදන	100 0	150 0	200 0
ජංගම එළවළු වෙළෙඳාම හා වෙනත්	100 0	150 0	200 0

12-270/11

දොම්පෙ ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද 1952 අංක 06 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 සහ 3 වගන්තිය යටතේ අංක 1947/6 සහ 2015.12.28 දින පළ වී ඇති *ගැසට් පත්‍රයේ* විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද, තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රයේ 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2019 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2020 වර්ෂය සඳහා ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

	I *වැනි තීරුව*	II *වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටල් හා ලැඟුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	සංචාරක වෙළඳාම් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

පළමුවන උපලේඛනය

පීඩාකාරී ව්‍යාපාර :

	I *වැනි තීරුව*	II *වැනි තීරුව*		
	කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
05.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
08.	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
09.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම	500 0	750 0	1,000 0
15.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල්ලෙලි පෙඟවීම හෝ (පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	II වැනි තීරුව		
	කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත හෝ අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42.	ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාෂභෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0

දෙවන උපලේඛනය

අන්තරාදායක ව්‍යාපාර :

1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
7.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස් ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

	I *වැනි තීරුව*	II *වැනි තීරුව*		
	කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
12.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
25.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	තෙවන උපලේඛනය			
පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :				
1.	රසායනික ද්‍රව්‍ය පාවිච්චිකර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
3.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	බැටරි විද්‍යුත් ආරෝපනය හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I *වැනි තීරුව*	II *වැනි තීරුව*		
	කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
15.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් බනිජ වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

12-158/1

දොම්පෙ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළ කර්මාන්ත බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. කාඩ්බෝඩ් සහ කාඩ්බෝඩ් ආශ්‍රිත නිෂ්පාදන විකිණීම, ගබඩා කිරීම හා බෙදාහැරීම	500 0	750 0	1,000 0
2. ළදරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
3. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
5. ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. ඉලෙක්ට්‍රෝනික උපකරණ සඳහා පරිපථ පුවරු නිපදවීම	500 0	750 0	1,000 0
7. කැටයම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම	500 0	750 0	1,000 0
8. කෘෂි උපකරණ අලෙවිය සහ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9. මිනී පෙට්ටි සාදන හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. විදුලි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. රබර් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12. රබර් මිශ්‍ර කොහු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13. වානේ ගෘහ භාණ්ඩ අමතර කොටස් නිපදවීම	500 0	750 0	1,000 0
14. වානේ ගෘහ භාණ්ඩ එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. බොත්තම් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. යකඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. තිරිවානා ගල් සකසා අපනයනය කිරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. යකඩවලින් ගොඩනැගිලි සැකිලි සැකසීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. හඳුන්කුරු නිපදවීම	500 0	750 0	1,000 0
20. කාඩ්බෝඩ් ඇසුරුම් නිපදවීම	500 0	750 0	1,000 0
21. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. රෙදි මෝස්තර මුද්‍රණය කිරීම සහ පින්තාරු කිරීම සඳහා	500 0	750 0	1,000 0
25. බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීම සඳහා	500 0	750 0	1,000 0
26. යෝගට් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
27. බීඩි නිපදවීම	500 0	750 0	1,000 0
28. ඇළුමිනියම් බඳුන් නිපදවීම	500 0	750 0	1,000 0
29. යන්ත්‍රානුසාරයෙන් රබර් දුම් ගැස්සවීම	500 0	750 0	1,000 0
30. අත්යන්ත්‍ර මාර්ගයෙන් රබර් දුම් ගැස්සවීම	500 0	750 0	1,000 0
31. පැණි නිපදවීම, ගබඩා කිරීම සහ විකිණීම සඳහා	500 0	750 0	1,000 0
32. කොප්පරා නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
33. හුණු පිළිස්සීම හෝ පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
34. රබර් ගම් බූට්ස් නිපදවීම	500 0	750 0	1,000 0
35. අම්ලකර වායුව (ඔක්සිජන්) භාවිතා කරන යකඩ කම්හලක්	500 0	750 0	1,000 0
36. කඩදාසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37. යන්ත්‍රානුසාරයෙන් සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
38. පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන ගබඩා කිරීම, බෙදා හැරීම හා නිෂ්පාදනය සඳහා	500 0	750 0	1,000 0
39. අයිස් පැකට් කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
කර්මාන්තය		*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
40.	පානීය ජලය බෝතල්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	ඔට්ටු පාලු අඹරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ජලජ පැළෑටි නිපදවීම	500 0	750 0	1,000 0
43.	බිම් මල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
44.	නූඩ්ල්ස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
45.	කුළු බඩු පැකට් කිරීම	500 0	750 0	1,000 0
46.	කොන්ක්‍රීට් සහ උළු හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ (චිප්ස් නිපදවීම)	500 0	750 0	1,000 0
47.	කොහු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
49.	පැඟිරි තෙල් හෝ පොල් තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
50.	පිත්තල සහ තඹ උණු කිරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	බයිට් පැකට් කිරීම	500 0	750 0	1,000 0
52.	බිස්කට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

12-158/2

දොම්පෙ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තිය අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1199 හා 2001.08.24 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2019 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෝක්ෂණය 2020 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් පහත සඳහන් වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවට,

වැකේ උප කාර්යාල බල ප්‍රදේශය	9%
පූගොඩ උප කාර්යාල බල ප්‍රදේශය	7%
දොම්පෙ උප කාර්යාල බල ප්‍රදේශය	6%
කෑරගල උප කාර්යාල බල ප්‍රදේශය	4%

තව ද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද දොම්පෙ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2020 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට 10% ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල දොම්පෙ සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද, දොම්පෙ ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත්, යෝජනා කරමි.

උපලේඛනය

I	*II*	*III*
කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2020.01.31 සිට 2020.03.31	2020.01.31
දෙවන කාර්තුව	2020.04.01 සිට 2020.06.30	2020.04.30
තුන්වන කාර්තුව	2020.07.01 සිට 2020.09.30	2020.07.31
හතර වන කාර්තුව	2020.10.01 සිට 2020.12.31	2020.10.31

11-158/3

දොම්පෙ ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිඳිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 හා අංක 1976/21 දරන 2016.07.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) කොටසේ පළාත් සභා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් පරිශ්‍රයකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාර්ෂික ගාස්තුවක් 2020 වර්ෂය සඳහා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	පුවරුවේ ස්වභාවය	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
01.	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
02.	රෙදි ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250.00	350.00	500.00
		3ට වැඩි	3ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින්		
04.	විදුලිය යොදාගෙන ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින්		
05.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
06.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
07.	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750.00	850.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500.00 බැගින්		

දොම්පෙ ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම - 2020

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ 176 වැනි අධිකාරය 3 වැනි වගන්තිය අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිඳිවැල.

යෝජනාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ 176 වැනි අධිකාරය 3 වැනි වගන්තිය ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන සියලුම නාට්‍ය, චේදිකා නාට්‍ය, චිත්‍රපට දර්ශන, සංගීත සංදර්ශන, සර්කස් දර්ශන හා විවිධ දර්ශන සඳහා මෙහි පහත උපලේඛනයේ දැක්වෙන බලපත්‍ර ගාස්තු 2020 වර්ෂය තුළ පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	රු. ශත
1. දින එකකට හෝ දින තුන නොඉක්මවන විට	500 0
2. දින තුන ඉක්මවන සෑම දිනයකටම හෝ ඉන් කොටසකට (රු. 500 ට අමතරව)	100 0

12-158/5

දොම්පෙ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තොබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිඳිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ පහත ඇති උපලේඛනයේ සඳහන් පරිදි වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම 2020 වර්ෂය සඳහා බද්දක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

		රු. ශත
01.	මෝටර් රථයක්, ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ කාර්යන් නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4 0
03.	සෑම කරත්තයක් සඳහා	20 0
04.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
05.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
06.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
07.	සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පුද්ගලික ස්ථානවල දී පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත හෝ වෙළෙඳ කාර්යයන් සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ ලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයෙන් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍යයක් හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-158/6

දොම්පෙ ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරය 2019 වර්ෂයේ මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වන තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *2019 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-158/7

දොම්පෙ ප්‍රාදේශීය සභාව

2020 ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇතැම් ඉඩම් විකිණීම මත බද්ද 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිඳිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ තිබෙන යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% සමාන බද්දක් විකුණුම්කරු හෝ අනුගාමිකයා විසින් දොම්පෙ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

12-158/8

දොම්පෙ ප්‍රාදේශීය සභාව

ක්‍රීඩා භූමි පරිහරණය කිරීමට අය කරන ගාස්තු - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 හා අංක 1976/21 දරන 2016.07.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් සභා *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාවට අයිති පහත උපලේඛනයේ සඳහන් පරිදි ක්‍රීඩා භූමි සඳහා ගාස්තු අය කිරීමට 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 හා අංක 1976/21 දරන 2016.07.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් සභා *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාවට අයිති පහත උපලේඛනයේ සඳහන් පරිදි ක්‍රීඩා භූමි සඳහා ගාස්තුවක් 2020 වර්ෂයේ දී පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට අය කරන ගාස්තු

	ක්‍රීඩා භූමියේ නම	*ගාස්තුව රු. ශත දිනකට*	*තැන්පත් මුදල රු. ශත*
01.	මාළිගාවත්ත ක්‍රීඩාංගණය -		
	ව්‍යාපාරික නොවන	5,000 0	5,000 0
	ව්‍යාපාරික	20,000 0	20,000 0
1.1	බල ප්‍රදේශයේ පාසල් සඳහා ආධාර පිණිස පවත්වන ප්‍රසංග	10,000 0	10,000 0
02.	වානළුවාව ක්‍රීඩාංගනය :		
	ව්‍යාපාරික නොවන	5,000 0	නැත
	ව්‍යාපාරික	10,000 0	10,000 0

සැ. යු. - සියලු ගාස්තුවලට රජයේ බදු මුදල් අය කෙරේ.
තාක්ෂණ නිලධාරි වාර්තා අනුව තැන්පත් මුදල නිදහස් කෙරේ.

12-158/9

දොම්පෙ ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු අය කිරීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් සභා *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය

සභාව පහත උපලේඛනයේ සඳහන් පරිදි සේවා සඳහා ගාස්තු අය කිරීමට 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් 25 වැනි දින,
කිරිදිවැල,
දොම්පෙ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් සභා *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාව පහත උපලේඛනයේ සඳහන් පරිදි සේවා සඳහා ගාස්තු 2020 වර්ෂයට අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

ඉල්ලුම් පත්‍රය	*ගාස්තුව රු. ශත*
1. සභාව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සඳහා ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍රය	100 0
2. සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල සාමාජිකයන් සඳහා ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍රය	50 0
3. වරිපනම් ලේඛනයේ උදෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය	100 0
4. වීථි රේඛා සහතිකයක්/නොපවරාගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය	100 0

සහතික පත්‍රය	*ගාස්තුව රු. ශත*
1. වීථි රේඛා සහතිකයක්/නොපවරාගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා සහතික පත්‍රය	500 0
2. වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික පත්‍රය	500 0
3. වරිපනම් ලේඛනයේ උදෘත සනාථ කරන සහතික	500 0
4. නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික	500 0

සැ. යු. - සියලු ගාස්තුවලට රජයේ බදු මුදල් අය කෙරේ.

12-158/10

දොම්පෙ ප්‍රාදේශීය සභාව

සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු අයකිරීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 හා අංක 1976/21 දරන 2016.07.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් සභා *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ සැරසිලි විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාවට අයිති පහත උපලේඛනයේ සඳහන් පරිදි සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු 2019

වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 හා අංක 1976/21 දරන 2016.07.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ඇ) කොටසේ පළාත් සභා *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ සැරසිලි විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රදේශීය සභාවට අයිති පහත උපලේඛනයේ සඳහන් පරිදි සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු 2020 වර්ෂයට අය කිරීමට යෝජනා කරමි.

1. සැරසිලි සඳහා ගාස්තුව :

වර්ග මීටර් 500 දක්වා	රු. 3,000 0
වැඩිවන සෑම වර්ග මීටරයක් සඳහා රු. 100 බැගින් අය කෙරේ.	

(සැරසිලි කර පැය 24 ක් ඇතුළත ඉවත් නොකරන්නේ නම් ඒ සඳහා ශ්‍රමික ගාස්තුව වශයෙන් දිනකට රු. 1,000 0)

12-158/11

දොම්පෙ ප්‍රාදේශීය සභාව

ඉල්ලුම්පත් හා සේවා සඳහා ගාස්තු පැනවීම - 2020

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන ලද ඉල්ලුම්පත් සේවා සහ සභාවට අයිති වත්කම් කුළියට දීම හා මෙහි පහත සඳහන් ප්‍රකාර ගාස්තු 2020 වර්ෂය තුළ පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

	රු. ශත
1. ආදාහනාගාර ගාස්තු :	
බල ප්‍රදේශය තුළ	6,000 0
බල ප්‍රදේශයෙන් පිටත	6,500 0
2. සුසාන භූමි ගාස්තු අය කිරීම වර්ග අඩියකට :	
(තැන්පත් කිරීම හෝ ස්මාරක ඉදි කිරීම)	400 0
3. ප්‍රජා ශාලා ගාස්තු අය කිරීම (දිනකට) :	
ව්‍යාපාරික නොවන	4,000 0
(ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල සඳහා රු. 2,000)	
ව්‍යාපාරික	7,000 0
(ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල සඳහා රු. 5,000)	

		රු. ශත
4.	පුස්තකාල සාමාජික ගාස්තු :	
	ළමා	100 0
	වැඩිහිටි	100 0
5.	පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට :	
	වැඩිහිටි	2 0
	ළමා	1 0
6.	කිරිදිවැල ප්‍රාදේශීය සභා පැරණි කාර්යාල භූමිය දිනකට තාවකාලිකව ලබා දීම (වර්ග අඩි 100)	1,000 0
7.	ඔප්පු සාරාංශ අයදුම්පත්	100 0
8.	පරිසර බලපත්‍ර අයදුම්පත්	500 0
9.	පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර අළුත් කිරීමේ ගාස්තු	500 0
10.	පස් ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීමේ අයදුම්පත්‍රය	1,000 0
11.	කොඩි කණුවක් කුළියට දීම (දිනකට) (ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල කොඩි කණුවක් සඳහා රු. 100)	20 0
12.	හිස් වතුර බවුසරයක් දිනකට (ප්‍රවාහනය අයදුම්කරු විසින් කළ යුතු ය)	1,500 0
13.	තල කම්පනය කුළියට ලබා දීම ඉන්ධන රහිතව ක්‍රියාකරු සමඟ දිනකට	3,500 0
14.	ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් සහතිකයක් වෙනුවෙන් අය කරන ගාස්තු (තැන්පත් මුදල රු. 50)	500 0
15.	නළ ළිං අළුත්වැඩියාව	500 0
16.	ගලි බවුසරය සඳහා ගාස්තු අය කිරීම :	
	ව්‍යාපාරික නොවන (සභා බල ප්‍රදේශය තුළ)	3,500 0
	ව්‍යාපාරික නොවන (සභා බල ප්‍රදේශයෙන් පිටත)	5,000 0
	ව්‍යාපාරික (සභා බල ප්‍රදේශය තුළ)	6,000 0
	ව්‍යාපාරික (සභා බල ප්‍රදේශයෙන් පිටත)	7,500 0
	දුර ප්‍රමාණ අනුව කි. මී. 1 කට රු. 70 බැගින් ප්‍රවාහන ගාස්තුවක් අය කෙරේ.	
17.	මෝටර් ග්‍රේඩරය මීටර පැය 01 ක් සඳහා ගාස්තුව (අවම පැය 04 ක් විය යුතු යි)	4,120 0
18.	JCB යන්ත්‍රය මීටර් පැය 01 ක් සඳහා ගාස්තුව (දුර ප්‍රමාණ අනුව 1Km කට රු. 100 බැගින් ප්‍රවාහන ගාස්තුවක් අය කෙරේ)	2,400 0
19.	ලොකු මාර්ග තලනය (දිනකට)	7,300 0
20.	කුඩා මාර්ග තලනය (දිනකට)	3,500 0

		රු. ශත
21.	උත්සව සහ ප්‍රසංග සඳහා ආලෝක උපකරණ/ශබ්ද වාහිනී උපකරණ/මාධ උපකරණ කුලියට දීමේ දී අයකරනු ලබන ගාස්තු	
	සාමාන්‍ය උත්සව සඳහා :	
	ශබ්දවාහිනී යන්ත්‍ර (වරුවක් සඳහා)	5,000 0
	ශබ්දවාහිනී යන්ත්‍ර (දිනක් සඳහා)	8,000 0
	අලෝක පහන් සමග ශබ්දවාහිනී යන්ත්‍ර (වරුවක් සඳහා)	6,500 0
	අලෝක පහන් සමග ශබ්දවාහිනී යන්ත්‍ර (දිනක් සඳහා)	9,000 0
	විවාහ උත්සව සඳහා :	
	ශබ්දවාහිනී යන්ත්‍ර (වරුවක් සඳහා)	6,000 0
	ශබ්දවාහිනී යන්ත්‍ර (දිනක් සඳහා)	8,500 0
	ක්‍රීඩා තරඟ සඳහා දිනකට ශබ්දවාහිනී යන්ත්‍ර	3,500 0
	DJ වරුවක් සඳහා	7,700 0
	DJ දිනක් සඳහා	11,000 0
	පැය 1-2 වැඩ සටහන් සඳහා (මොන්ටර්ස්)	3,000 0
	වීඩියෝ කැමරාව දිනකට	7,000 0
	ඡායාරූපකරණය සඳහා කැමරාව දිනකට	5,000 0
	FM මයික්‍රපෝන 2ට වඩා වැඩිවන සෑම අවස්ථාවකම මයික්‍රපෝන යුගලක් සඳහා රු. 1,000.00 බැගින් අය කිරීම. වරුවක් ලෙස පැය.006ක කාලයක් දක්වෙන අතර වැඩිවන සෑම පැයකටම රු. 1,000.00 ක් අය කිරීම. වැඩිවන විදුලි පහන් යුගලක් සඳහා රු. 5,000.00 ක් අය කිරීම.	
	ප්‍රධාන කාර්යාලයේ සිට කි. මී. 10ක දුරක් හා ආසනය තුළ ප්‍රවාහනය නොමිලේ සිදු කරන අතර එම සීමාවෙන් පිටත කි. මී. 1ක් සඳහා රු. 70.00ක් අය කෙරේ.	

මෙම සියලු ගාස්තු සඳහා රජයේ බදු මුදල් අය කෙරේ.

12-158/12

දොම්පෙ ප්‍රාදේශීය සභාව

ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ රීති යටතේ ගාස්තු අය කිරීම 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය සහ 109 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 2008 අංක 01 දරන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති යටතේ සාදා ඇති කසල එකතු කිරීම මත ගාස්තු 2020 වර්ෂය සඳහා කසල බැහැර කිරීම වෙනුවෙන් නියම කර ඇති ගාස්තු දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අය කිරීම 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිඳිවැල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය සහ 109 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 2008 අංක 01 දරන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති යටතේ සාදා ඇති කසල එකතු කිරීම මත ගාස්තු 2020 වර්ෂය සඳහා කසල බැහැර කිරීම වෙනුවෙන් නියම කර ඇති ගාස්තු දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනය යටතේ අය කිරීමට යෝජනා කරමි.

අංකය	*වර්ගය*	*අපද්‍රව්‍ය ජනනය අනුව වර්ගීකරණය*	*දිනකට අපද්‍රව්‍ය ප්‍රමාණය* (Kg)	*මාසික ගාස්තුව* (Rs.) *රජයේ බදු මුදල් එකතුවිය යුතුයි*
01	හෝටල් (දේශීය සහ විදේශීය)	මහා පරිමාණ	>50	22,500 - 50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000 - 22,500
		කුඩා පරිමාණ	<10	1,000 - 5,000
02	නේවාසිකාගාර/හෝටල්	මහා පරිමාණ	>10	5,000 - 25,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500 - 5,000
		කුඩා පරිමාණ	<5	500 - 2,500
03	අවන්හල්/ආහාර ලබාගනු ලබන ස්ථාන/උත්සව ශාලා	මහා පරිමාණ	>50	22,500- 50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000-22,500
		කුඩා පරිමාණ	<10	500-5,000
04	සුපිරි වෙළෙඳසැල්	මහා පරිමාණ	>50	22,500- 50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000-22,500
		කුඩා පරිමාණ	<10	1,000-5,000
05	එළවළු/පලතුරු/මාළු/මස් වෙළෙඳසැල් මහා පරිමාණ	මහා පරිමාණ	>10	5,000-25,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500-5,000
		කුඩා පරිමාණ	<5	500-2,500
06	කර්මාන්ත ශාලා (උපද්‍රවකාරී නොවන)	මහා පරිමාණ	>50	22,500-50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000- 22,500
		කුඩා පරිමාණ	<10	1,000 - 5,000
07	පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ බෙහෙත්ශාලා (ආසාදිත නොවන)	මහා පරිමාණ	>30	20,000 - 50,000
		මධ්‍ය පරිමාණ	15-30	10,000 - 20,000
		කුඩා පරිමාණ	<15	1,000-10,000
08	අනෙකුත් වාණිජ ආයතන (රාජ්‍ය/පුද්ගලික)	මහා පරිමාණ	>30	15,000-40,000
		මධ්‍ය පරිමාණ	10-30	5,000-15,000
		කුඩා පරිමාණ	<10	500-5,000
09	සේවා සපයනු ලබන ආයතන (රාජ්‍ය/පුද්ගලික)	මහා පරිමාණ	>10	5,000-25,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500-5,000
		කුඩා පරිමාණ	<5	500-2,500
10	ආගමික ස්ථාන	මහා පරිමාණ	>25	5,000-15,000
		මධ්‍ය පරිමාණ	5-25	1,000-5,000
		කුඩා පරිමාණ	<5	500-1,000

12-158/13

දොම්පෙ ප්‍රාදේශීය සභාව

කර්මාන්ත ශාලා වලින් කසළ බැහැර කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම - 2020

1897 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ශාලාවලින් ජනනය වන කසළ සනීපාරක්ෂිත කසළ රඳවනය වෙත බැහැර කිරීම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා කි. ග්‍රෑම් 1 ක් සඳහා රු. 5 ක මුදලක් (බදු මුදල් ඇතුලත්ව) අය කිරීම 2019 වර්ෂයේ ඔක්තෝබර් 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින.

යෝජනාව

1897 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දොම්පෙ ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ශාලාවලින් ජනනය වන කසළ සනීපාරක්ෂිත කසළ රඳවනය වෙත බැහැර කිරීම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා කි. ග්‍රෑම් 1 ක් සඳහා රු. 5 ක මුදලක් (බදු මුදල් ඇතුලත්ව) අය කිරීමට යෝජනා කරමි.

12-158/14

දොම්පෙ ප්‍රාදේශීය සභාව

ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම - 2020

1897 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා ඇති අතුරු ව්‍යවස්ථාව අනුව 1988 දරන *ගැසට්* නිවේදනය ප්‍රකාරව වැළඳගෙන ඇති අතර ඒ අනුව ප්‍රකාශයට පත් කර ඇති ත්‍රීරෝද රථ නැවතුම්පොල වල නවතා ඇති ත්‍රීරෝද රථ වලින් 2020 සඳහා ගාස්තු අය කිරීම 2019 වර්ෂයේ ඔක්තෝබර් 16 වැනි දින පවත්වන ලද දොම්පෙ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
කිරිදිවැල.

යෝජනාව

1897 අංක 15 දරන ප්‍රාදේශී සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා ඇති අතුරු ව්‍යවස්ථා අනුව 1988 දරන *ගැසට්* නිවේදනය ප්‍රකාරව වැළඳගෙන ඇති අතර ඒ අනුව ප්‍රකාශයට පත් කර ඇති පහත සඳහන් ත්‍රීරෝද රථ නැවතුම්පොළ වල පනවා ඇති ත්‍රීරෝද රථවලින් 2020 සඳහා ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

ත්‍රීරෝද රථ නවතා තබන ස්ථානය	*එක වාරයකට නවතා තැබිය හැකි ත්‍රීරෝද රථ සංඛ්‍යාව*
01. කිරිදිවැල නගරයේ සතිපොල අසල හංවැල්ල පාර ත්‍රීරෝද රථ නැවතුම්පොල	05
02. යූමී බේකර්ස් හවුස් අසල ත්‍රීරෝධ රථනැවතුම්පොල	11

අයකරන ගාස්තු :-

එක් ත්‍රීරෝද රථයක් සඳහා වර්ෂයකට ගාස්තුව රු. 600.00

සැ. යු.- (සියළු ගාස්තුවලට බදු මුදල් අය කෙරේ.)

12-158/15

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ 1.3.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේ දී තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ i වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ ii තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ පසුගිය වර්ෂයේ ලැබීම් වලින් සියයට එකක් (1%) නොඉක්මවිය යුතු බවට තුම්පනේ ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

පීඩාකාරී ව්‍යාපාර

උපලේඛනය 1

අනු. අංකය	*1 වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය*	*11 වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු.	*රු.*	*රු.*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තැබීම	500	750	1,000
02.	සම්පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම හෝ සම් විකිණීම	500	750	1,000
03.	සත්ත්ව පාලනය, (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500	750	1,000

අනු. අංකය	1 වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	11 වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු.	රු.	රු.
04.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500	750	1,000
05.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500	750	1,000
06.	විකිණීම සඳහා නරක් වන සුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500	750	1,000
07.	කරවල, ලුණුවල හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500	750	1,000
08.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
09.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500	750	1,000
10.	සබන් නිෂ්පාදනය කිරීම	500	750	1,000
11.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500	750	1,000
12.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
13.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම	500	750	1,000
14.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500	750	1,000
15.	රසකැවිලි වර්ග නිපදවීම	500	750	1,000
16.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500	750	1,000
17.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
18.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම,	500	750	1,000
19.	සම් භාණ්ඩ නිපදවීම	500	750	1,000
20.	පළතුරු මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500	750	1,000
21.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග මාංශභෝග කුලු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500	750	1,000
22.	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
23.	සිමෙන්ති භාණ්ඩ හෝ අස්බැස්ටොස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500	750	1,000
24.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500	750	1,000
25.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝ ග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000

අන්තරාදයක ව්‍යාපාර - උපලේඛනය 2

01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500	750	1,000
03.	මුද්‍රණාලයක් පැවැත්වීම	500	750	1,000
04.	කුකුළන් 50 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500	750	1,000
05.	එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500	750	1,000
06.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500	750	1,000
